# 2022 දෙසැම්බර් මස මාසික සභා රැස්වීමේ සංශිප්ත වාර්තාව

## තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව

**ස්ථානය - තිස්සමහාරාම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව**
**දිනය - 2022.12.20**
**වේලාව - පෙ.ව. 10.30**

**පැමිණීම -**

| | | |
|---|---|---|
| I. | ඩබ්ලිව්.ජී. උපුල් මහතා | - ගරු සභාපති |
| II. | විදාන ගමගේ සුදත් මහතා | - ගරු උප සභාපති |
| III. | කේ.එච්. ගාමිණී මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IV. | ඩබ්.කේ. ටෂිත සමිල මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| V. | ඒ.පී. ධම්මික මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VI. | ආර්.රජිත ප්‍රියදර්ශන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VII. | චතුමිණී විජේනායක මෙනවිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VIII. | ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IX. | ආර්.කේ.එම්. රෝහිත මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| X. | පී.කේ. ආරියසේන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XI. | එන්.ජී. සරත් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XII. | වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIII. | චමින්ද ඩයස් වන්නිගේ මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIV. | ජී.එච්.ජී. නීටා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XV. | වැල්ලගේ ජීවානි මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVI. | ඒ.ඩබ්. නන්දා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVII. | ඩබ්.කේ. සිසිර කුමාර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVIII. | පී.එල්. චාලි ගුණරත්න මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |

**නොපැමිණීම -**

| | | |
|---|---|---|
| I. | හර්ෂ උදය කුමාර ජයවීර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| II. | එල්.එච්. කුමුදු සුජීව මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| III. | කපිල ඉන්ද්‍රජිත් ශ්‍රීවර්ධන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |

ප්‍රථමයෙන්ම සියලුම දෙනා පංචසීලය සමාදන් වීමෙන් අනතුරුව, රට වෙනුවෙන් දිවිපිදූ විරෝධාර රණවිරුවන්ට, ප්‍රාදේශීය සභාවේ ධූර කාලය දරා, මේ වන විට මිය ගොස් ඇති බුද්ධදාස ජයසූරිය මහතා ඇතුළු ගරු සභාපතිවරුන්ට, ගරු උප සභාපති ලෙස සිට මිය ගොස් ඇති ඩබ්.කේ. ප්‍රේමදාස මහතා හා

අප සභාව නියෝජනය කළ ගරු සභික, එච්.ජේ.කේ.ජී. විජේරාම මහතාත්, ගරු සභිකවරුන් ඇතුළුව මියගිය සියලුම දෙනාට උපහාර දක්වමින්, විනාඩි දෙකක නිෂ්ශබ්දතාවය පළ කරන ලදී.

ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් 2022 වර්ෂයට අදාළ අවසන් මහා සභාව පැවැත්වෙන අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්, ලේකම්තුමිය ඇතුළු පිරිස පිළිගනිමින් න්‍යාය පත්‍රානුකූලව සභා කටයුතු ආරම්භ කරන ලදී.

**(අ) (i) 2022.11.17 වන දින පවත්වන ලද මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

2022.11.17 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන ලෙස ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා යෝජනා කරන ලදී. 2022.11.17 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන බව ගරු ප්‍රාදේශීය සභා සභික ඩබ්.කේ. ටෂිත සමිල මහතා යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ, ගයාන් සඳරුවන් මතා විසින් ස්ථිර කරන ලදී.

**(ii) 2022.12.05 වන දින පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

2022.12.05 දිනැති විශේෂ මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන ලෙස ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා යෝජනා කරන ලදී. 2022.12.05 දිනැති විශේෂ මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන බව ගරු ප්‍රාදේශීය සභා සභික පී.කේ. ආරියසේන මහතා යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශීය සභා සභික, වාලි ගුණරත්න මහතා විසින් ස්ථිර කරන ලදී.

**(ආ) ගරු සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදනය -**

I. ගරු ප්‍රාදේශීය සභා සභික, හර්ෂ ජයවීර මහතා එවා ඇති නිවාඩු ලිපිය නිවේදනය කරන ලදී.

ඒ අනුව, ගරු ප්‍රාදේශීය සභා සභික, හර්ෂ ජයවීර මහතා විසින් එවා ඇති නිවාඩු ලිපිය පරිදි එතුමන්ගේ නිවාඩුව මහා සභාව විසින් අනුමත කරන ලදී.

II. තිස්සමහාරාම බල ප්‍රදේශයේ සිදු කරනු ලබන ඉඩම් අනුබෙදුම් අනුමත කිරීම, ගොඩනැගිලි සංවර්ධන අනුමත කිරීම හා අනුකූලතා සහතික නිකුත් කිරීම සඳහා 2022 වර්ෂයේ නොවැම්බර් මස දක්වා සැලසුම් කමිටුවට යොමු කරන ලද සැලසුම්පත් ලේඛන ගරු මහා සාබවට ඉදිරි කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

| **2022 නොවැම්බර් මාසය– සැලසුම් කමිටු වාර්තාව** | | | | |
|---|---|---|---|---|
| **අනු අංක** | **ලි.ප.අ.** | **නම** | **අනුමත වීම/නොවීම** | **කමිටු දිනය** |
| 1 | අ/බෙ./2018/110 | එස්.ඒ.නිමල් | අනුමත නොවිය | 2022.11.09 |
| 2 | අ/බෙ/2022/84 | එම්.ඒ.සමන් රාජිත | අනුමත වීය | 2022.11.09 |
| 3 | අ/බෙ/2022/94 | ඊ.ජී.ඒ.ගාමිණී මුණිදාස | අනුමත විය | 2022.11.09 |
| 4 | අ/බෙ/2022/86 | ඒ.ඒ.රූපසිංහ | අනුමත වීය | 2022.11.09 |
| 5 | අ/බෙ/2022/88 | ඩී.ජේ. දයානන්ද | අනුමත වීය | 2022.11.09 |
| 6 | සං/අ/2022/76 | එම්.එල්.කේ.සරත්චන්ද්‍ර | අනුමත නොවීය | 2022.11.09 |
| 7 | සං/අ/2022/69 | එම්.ඒ.සමන් රාජිත | අනුමත විය | 2022.11.09 |
| 8 | සං/අ/2021/115 | එම්. ඒ .අරුණ | අනුමත නොවිය | 2022.11.09 |

| | | | | |
|---|---|---|---|---|
| 9 | සං/අ/ 2021/111 | එම්.ටී.ඩී.පී.කුරේ | අනුමත විය | 2022.11.09 |
| 10 | සං/අ/2022/86 | ඩී.සී.කොඩිතුවක්කු | අනුමත විය | 2022.11.09 |
| 11 | සං/අ/2022/83 | ඒ.එස්.පියසේන | අනුමත විය | 2022.11.09 |
| 12 | සං/අ/2022/88 | ඒ.ආර්.කුරුප්පුආරච්චි | අනුමත විය | 2022.11.09 |
| 13 | සං/අ/2018/80 | කේ.වයි.කිත්සිරි | අනු.ස.අනුමත විය | 2022.11.09 |
| 14 | සං/අ/2019/12 | ටී.එම්.රපීක් | අනු.ස.අනුමත විය | 2022.11.09 |
| 15 | සං/අ/2018/59 | එස්.ජී.එල්.අජිත් ප්‍රියන්ත | අනු.ස.අනුමත විය | 2022.11.09 |
| 16 | සං/අ/2018/44 | එල්.වයි.දයාවතී | අනු.ස.අනුමත විය | 2022.11.09 |
| 17 | සං/අ/2018/70 | අයි.එච්.උපාලි | අනු.ස.අනුමත විය | 2022.11.09 |
| 18 | සං/අ/2022/37 | එම්.ආර්.එන්.එන්.මැණිකේ | අනු.ස.අනුමත විය | 2022.11.09 |
| 19 | සං/අ/2019/108 | එන්.ඩබ්.සමන් කුමාර | අනු.ස.අනුමත විය | 2022.11.09 |
| 20 | අ/බෙ./2022/97 | කේ.ඒ.චන්ද්‍රසේන | අනුමත විය | 2022.11.29 |
| 21 | අ/බෙ/2022/96 | එම්.ජී.සුනිල් | අනුමත විය | 2022.11.29 |
| 22 | අ/බෙ/2022/93 | අයි.අමදෝරු ගලපත්ති | අනුමත විය | 2022.11.29 |
| 23 | අ/බෙ/2022/16 | ඩී.ඩබ්.පී.නන්ද කුමාර | අනුමත විය | 2022.11.29 |
| 24 | අ/බෙ/2022/95 | එම්.බී.ගාමිණී | අනුමත විය | 2022.11.29 |
| 25 | අ/බෙ/2022/98 | එච්.ජී.චාමර මධුශංක | අනුමත විය | 2022.11.29 |
| 26 | අ/බෙ/2022/99 | රවී රජින්ද්‍ර රන්දිමාල් | අනුමත විය | 2022.11.29 |
| 27 | අ/බෙ/2022/101 | ඒ.ආර්.කුරුප්පුආරච්චි | අනුමත විය | 2022.11.29 |
| 28 | සං/අ/2020/126 | ජැක්සන් මුතුකුමාරණ | අනුමත විය | 2022.11.29 |
| 29 | සං/අ/2022/87 | සී.ඩී.කොඩිතුවක්කු | අනුමත විය | 2022.11.29 |
| 30 | සං/අ/2022/85 | එම්.ඒ.ඥානවිපුල | අනුමත විය | 2022.11.29 |
| 31 | සං/අ/2022/79 | අයි. අමදෝරු ගලප්පත්ති | අනුමත විය | 2022.11.29 |
| 32 | සං/අ/2022/86 | ඩී.සී.කොඩිතුවක්කු | අනුමත විය | 2022.11.29 |
| 33 | සං/අ/2022/83 | ඒ.එස්.පියසේන | අනුමත විය | 2022.11.29 |
| 34 | සං/අ/2022/88 | ඒ.ආර්.කුරුප්පුආරච්චි | අනුමත විය | 2022.11.29 |
| 35 | සං/අ/2022/71 | එල්.එච්.ධනුෂ්ක කුමාර | අනුමත විය | 2022.11.29 |
| 36 | සං/අ/2022/84 | තිළිණ කුලකුලසූරිය | අනුමත නොවීය | 2022.11.29 |
| 37 | සං/අ/2022/91 | එම්.වර්ෂ හැන්නදිගේ | අනුමත විය | 2022.11.29 |
| 38 | සං/අ/2018/48 | පතිරණගේ සුපුණිකා | අනු.ස.අනුමත විය | 2022.11.29 |

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන**

I. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යනු ලබන පෙර පාසල් 06 හි දරුවන් සඳහා ප්‍රෝටීන බහුල ආහාර ලබා දීමට පළාත් පාලන දෙපාර්තමේන්තුව හා දකුණු පළාත් ආණ්ඩුකාරවර මගින් දැනුවත් කර ඇති පරිදි, එක් දරුවකු සඳහා දිනකට රු. 60.00 ක් වැය කොට තම්බන ලද බිත්තරයක්, යෝගට් 01, තම්බන ලද එළවලු කැබලි, පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇති පෝෂණ කැද, නැවුම් එළකිරි, තම්බන ලද ධාන්‍ය, කෙසෙල් වැනි පළතුරු ආදිය අතරින් මුදලේ වටිනාකමට සරිලන ආහාර සතියකට දින 02 ක් වන සේ මසකට දින 08 ක් ලබා දීමට කටයුතු කර ඇති අතර, ඒ සඳහා පළාත් පාලන ආයතනය සතු අරමුදල් යොදවමින් ක්‍රියාත්මක කරන ලෙසටත් ඉහත කී ලිපි මගින් දන්වා ඇත. ඒ අනුව, සභාව සතු පෙර පාසල් 06 හි දරුවන් සඳහා පහත සඳහන් මාසයන්වල ලබා දුන් පෝෂණ ආහාරවේල් හි වියදම් විස්තරය ගරු මහා සභාවට ඉදිරිපත් කරමි.

- 2022 ඔක්තෝම්බර් මාසය - රු. 139,100.00
- 2022 නොවැම්බර් මාසය - රු. 121,300.00

II. පන්නෙගමුව මහාවාපි විහාරස්ථානයේ 2022 වර්ෂයේ නිමාව සනිටුහන් කරමින් සහ නව වර්ෂයේ ආරම්භය සනිටුහන් කරමින් ධර්ම දේශනා මාලාවක් සංවිධානය කර ඇති බවත්, ඒ සඳහා විහාරස්ථාන භූමිය ප්‍රාදේශීය සභාව මගින් සුද්ධ පවිත්‍ර කර දෙන ලෙසටත්, එම ආගමික වැඩසටහන් සඳහා ප්‍රාදේශීය සභාවේ සභාපති, ඇතුළු සියලුම මන්ත්‍රී මණ්ඩලයටත්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් ලිපියක් මගින් ආරාධනා කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

- <u>**අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**</u>

<u>පන්නෙගමුව මහාවාපි විහාරස්ථානය මගින් ප්‍රදේශවාසී ජනතාවට මෙන්ම සියලු රටවාසී ජනතාවට සෙත් පතා දින 07 ක් පුරාවට ආගමික වැඩසටහන් පැවැත්වීමට කටයුතු යොදා ඇති බැවින්, මෙම වැඩසටහන් සඳහා තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා ඇතුළු ගරු උප සභාපතිතුමාටත්, සියලුම ගරු සභිකවරුන්ටත්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ටත් ආරාධනා කර ඇති බැවින්, ඒ සඳහා සහභාගී වන ලෙසට දන්වා සිටින ලදී.</u>

<u>වාර්ෂිකව මෙලෙස ආගමික වැඩසටහන් මාලාවක් තිස්සමහාරාම රාජමහා විහාරස්ථානයේ සිදු කරනු ලබයි. එලෙසට සෑම කොට්ඨාසයකම ආගමික වැඩසටහන් සංවිධානය කිරීම සඳහා අදාළ කොට්ඨාසයන්ට අදාළ ධානපති ව්‍යාපාරිකයින් සමඟ සාකච්ඡා කර අවැසි වැඩපිළිවෙලක් සකස් කර ගන්නේ නම්, ඊට අදාළ දායකත්වයක් ප්‍රාදේශීය සභාව මගින් ද ලබා දිය හැකි බව ප්‍රකාශ කරන ලදී.</u>

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

- <u>**ගරු සභාපති විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනා**</u>

01. 2023 වර්ෂයට අදාළව සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම ක්‍රියාත්මක කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

02. 2023 වර්ෂයට අදාළව සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

03. 2023 වර්ෂයට අදාළව සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

04. 2023 වර්ෂයට අදාළව සකස් කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05. 2023 වර්ෂයේ දී පහත නම් සඳහන් කමිටු සාමාජිකයින්ගෙන් යුක්තව කාර්මික සේවා කාරක සභාව පත් කිරීමට මෙම ගරු සභාවට යොජනා කරමි.

01. ගරු සභාපති - ඩබ්.ජී. උපුල් මහතා (කමිටු සාමාජික)
02. ගරු උප සභාපති - සුදත් විදාන ගමගේ මහතා (කමිටු සාමාජික)
03. ගරු ප්‍රාදේශීය සභා සභික - කේ.එච්. ගාමිණී මහතා (කමිටු සාමාජික)
04. ගරු ප්‍රාදේශීය සභා සභික - ඩබ්.කේ. ටෂිත සමිල මහතා (කමිටු සාමාජික)
05. ගරු ප්‍රාදේශීය සභා සභික - ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා (කමිටු සභාපති)
06. ගරු ප්‍රාදේශීය සභා සභික - පී.කේ. ආරියසේන මහතා (කමිටු සාමාජික)
07. ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.පී. ධම්මික මහතා (කමිටු සාමාජික)
08. ගරු ප්‍රාදේශීය සභා සභික - එන්.ජී. සරත් මහතා (කමිටු සාමාජික)
09. ගරු ප්‍රාදේශීය සභා සභික - චතුමිණි දිල්ෂාණි මෙනවිය (කමිටු සාමාජික)
10. ගරු ප්‍රාදේශීය සභා සභික - වැල්ලගේ ජීවානි මහත්මිය (කමිටු සාමාජික)
11. ලේකම් - ඩී. රුවිනා දීපානි මිය (කමිටු සාමාජික)
12. ප්‍ර.කළමනාකරණ සේවා නිලධාරී- කේ.එන්.ජී. ප්‍රමිලා නදීෂිකා මිය (කමිටු සාමාජික)
13. සංවර්ධන නිලධාරී - එල්.පී. කල්පනී චමින්දිකා මිය (කමිටු සාමාජික)
14. සංවර්ධන නිලධාරී - ටී.එච්. සචිත්‍රා ප්‍රසාදනී මිය (කමිටු සාමාජික)
15. කළමනාකරණ සේවා නිලධාරී - ජේ.එම්. සමන්මලී මිය (කමිටු සාමාජික)
16. තාක්ෂණ සේවා නිලධාරී - එම්.ඩබ්.පී. චතුරිකා මෙය (කමිටු සාමාජික)
17. කළමනාකරණ සේවා නිලධාරී - බී.ඒ. සුරේෂි මධුෂාණි මෙය (කමිටු සාමාජික)
18. කළමනාකරණ සේවා නිලධාරී - ආර්.කේ. චමිලා මධුවන්ති මිය (කමිටු ලේකම්)
19. පරිගණක ක්‍රියාකරු - එල්.වයි. සුමංගලා සුබෝදිනී මිය (කමිටු සාමාජික)
20. කළමනාකරණ සේවා නිලධාරී - බී.කේ. ධම්මික සම්පත් මහතා (කමිටු සාමාජික)
21. වීථි පහන් විෂයභාර ලිපිකරු - ජේ.කේ.ටී. සඳකැලුම් මිය (කමිටු සාමාජික)
22. වැඩ පරිපාලක - චමින්ද කොඩිතුවක්කු මහතා (කමිටු සාමාජික)
23. විශ්‍රාමික නිලධාරී - යූ.කේ.ඩී. වික්‍රමරත්න මහතා (කමිටු සාමාජික)

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ කඩකාමර බදුහිමියන් හා කිරින්ද පූජා නගර රථවාහන නැවතුම්පොළ කඩකාමර බදුහිමියන් විසින් තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව වෙත කරන ලද ඉල්ලීම් ප්‍රකාරව 2022 මැයි මස සිට 2022 අගෝස්තු මස දක්වා ඉන්ධන අර්බුදය හේතුවෙන් රට තුල පැවැති අස්ථාවරත්වය හේතුවෙන් වන්දනාකරුවන්ගේ පැමිණීම අඩුවීමෙන් ඔවුන්ගේ ආදායම් මාර්ග නොමැතිවීම නිසා එම මාසවල කඩකුලිය අයකිරීම සම්බන්ධයෙන් යම් සහනයක් ඉල්ලා ඇත. ඒ අනුව , 2022 මැයි මස සිට 2022 අගෝස්තු මස දක්වා

අදාළ මුළු කඩකුලිය වන රු. 407,300.00 ක මුදල සහා ආදායමින් කපාහැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ඉදිරිපත් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්.රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

07. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් තිස්සමහාරාම පොදු වෙලඳපොල මාළු ලෑලි 18 හි හිඟ කඩකුලී රු. 307,650.00 ක මුදල කපා හැරීමට පළාත් පාලන කොමසාරිස් හා ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය පරිදි 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 182 වගන්තිය හා 1989 අංක 12 දරණ පළාත් සභා පනතේ (අනුශාංගික විධිවිධාන පනතේ) 2(1) (අ) වගන්ති ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමා විසින් G/SP/4/6/1/12 හා 2022.10.26 දින ලබාදුන් අනුමැතිය පරිදි තිස්ස මාළු වෙලඳසැලේ මාළු ලෑලි 18 හි හිඟ කඩකුලී රු. 307,650.00 ක මුදල ලේඛන වලින් කපාහැරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා

2012 වර්ෂයේ සිට තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් තිස්සමහාරාම පොදු වෙලඳපොල මාළු ලෑලි 18 හි වෙළඳාම් නොකිරීම මත, හිඟ කඩ කුලී ලෙස ලේඛනවල සටහන් වී ඇති රු. 307,650.00 ක මුදල කපා හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බැවින්, එම හිඟ කඩ කුලිය ලේඛන වලින් කපාහැරීම සඳහා මෙලෙස යෝජනාවක් ගෙන එන ලදී. මාලු වෙළඳසැලෙහි පවතින අඩුපාඩු සකස් කර එය අලුත්වැඩියා කිරීම සඳහා තීරණය කර තිබුණද, රටේ පැවැති ආදායම් අර්බුධකාරී තත්ත්වය නිසා, එය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. ඉදිරියේ දී මෙම මාලු වෙළඳසැල අලුත්වැඩියා කර ටෙන්ඩර් පටිපාටිය අනුව මාලු වෙළඳුන් සඳහා ලබා දීමට තීරණය කර ඇති බව ප්‍රකාශ කර සිටින ලදී.

❖ අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා

මාර්ග දෙපස මාර්ග රක්ෂිතයේ අනවසරයෙන් මාලු වෙළඳාම් කරනු ලබන මාලු ලෑලි ද ටෙන්ඩර් පටිපාටිය අනුව මෙම ස්ථානය සඳහා ගෙන ඒම සුදුසු බව දන්වා සිටින ලදී.

❖ අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා

මාර්ගය දෙපස අනවසර ඉදිකිරීම් බහුල වශයෙන් පවතිනු ඇත. එම නිසා එලෙසට මාර්ග රක්ෂිතයේ පවතින අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට අදාළ පියවර ගන්නා ලෙසට මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දන්වා යැවීමට තීරණය විය.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

08. හම්බන්තොට ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය මගින් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත අනුව, ඔප්පු සඳහා අය කරන මුද්දර ගාස්තු පළාත් පාලන ආයතනය සඳහා ආපසු ගෙවීම උදෙසා උපලේඛන පිළියෙල කිරීම වෙනුවෙන් රෙජිස්ට්‍රාර් ජනරාල්, කොළඹ වෙත ගෙවීමට නියමිත මුදල් 2017 වර්ෂය සඳහා පමණක් ගෙවා ඇති අතර, අදාළ මාස සඳහා ගෙවිය යුතු මුදල් ගෙවීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

| වර්ෂය | මාසය | උපලේඛන ගණන | උපලේඛනවලට අදාළව ලැබිය යුතු මුදල (රු) | උපලේඛන පිළියෙල කිරීම වෙනුවෙන් ගෙවීමට ඇති මුදල (රු) |
|---|---|---|---|---|
| | ජනවාරි | 36 | 1,938,500.00 | |

| | | | | |
|---|---|---|---|---|
| 2018 | පෙබරවාරි | 26 | 319,000.00 | 16,800.00 |
| | මාර්තු | 35 | 983,400.00 | |
| | අප්‍රේල් | 14 | 587,500.00 | |
| | මැයි | 35 | 896,500.00 | |
| | ජූනි | 22 | 2,414,250.00 | |
| | ජූලි | 35 | 1,121,500.00 | 14,800.00 |
| | අගෝස්තු | 29 | 792,000.00 | |
| | සැප්තැම්බර් | 50 | 2,614,800.00 | |
| | ඔක්තෝම්බර් | 34 | 1,087,064.00 | |
| | නොවැම්බර් | 28 | 1,318,200.00 | 6,400.00 |
| | දෙසැම්බර් | 36 | 2,288,500.00 | |
| මුළු එකතුව | | 380 | 16,361,214.00 | 38,000.00 |

| වර්ෂය | මාසය | උපලේඛන ගණන | උපලේඛනවලට අදාළව ලැබිය යුතු මුදල (රු) | උපලේඛන පිළියෙල කිරීම වෙනුවෙන් ගෙවීමට ඇති මුදල (රු) |
|---|---|---|---|---|
| 2019 | ජනවාරි | 32 | 1,538,500.00 | 3,200.00 |
| | පෙබරවාරි | 39 | 943,250.00 | 18,400.00 |
| | මාර්තු | 31 | 1,169,500.00 | |
| | අප්‍රේල් | 44 | 974,000.00 | |
| | මැයි | 29 | 1,134,300.00 | |
| | ජූනි | 41 | 1,150,000.00 | |
| | ජූලි | 34 | 966,000.00 | 12,700.00 |
| | අගෝස්තු | 34 | 862,000.00 | |
| | සැප්තැම්බර් | 34 | 1,076,250.00 | |
| | ඔක්තෝම්බර් | 25 | 1,224,000.00 | |
| | නොවැම්බර් | 28 | 1,287,700.00 | 2,800.00 |
| | දෙසැම්බර් | 41 | 708,200.00 | 4,100.00 |
| මුළු එකතුව | | 412 | 13,033,700.00 | 41,200.00 |

| වර්ෂය | මාසය | උපලේඛන ගණන | උපලේඛනවලට අදාළව ලැබිය යුතු මුදල (රු) | උපලේඛන පිළියෙල කිරීම වෙනුවෙන් ගෙවීමට ඇති මුදල (රු) |
|---|---|---|---|---|
| 2020 | ජනවාරි | 20 | 413,500.00 | 8,500.00 |
| | පෙබරවාරි | 27 | 609,980.00 | |
| | මාර්තු | 35 | 1,158,000.00 | |
| | අප්‍රේල් | 03 | 72,500.00 | |
| | මැයි | 18 | 640,500.00 | 5,000.00 |
| | ජූනි | 42 | 884,300.00 | |
| | ජූලි | 29 | 2,137,800.00 | 6,500.00 |
| | අගෝස්තු | 36 | 1,511,500.00 | |
| | සැප්තැම්බර් | 66 | 2,451,140.00 | 20,100.00 |
| | ඔක්තෝම්බර් | 46 | 1,796,280.00 | |
| | නොවැම්බර් | 46 | 1,910,000.00 | |
| | දෙසැම්බර් | 43 | 1,046,500.00 | |
| මුළු එකතුව | | 411 | 14,632,000.00 | 40,100.00 |

| වර්ෂය | මාසය | උපලේඛන ගණන | උපලේඛනවලට අදාළව ලැබිය යුතු මුදල (රු) | උපලේඛන පිළියෙල කිරීම වෙනුවෙන් ගෙවීමට ඇති මුදල (රු) |
|---|---|---|---|---|
| 2021 | ජනවාරි | 26 | 864,250.00 | 17,500.00 |
| | පෙබරවාරි | 43 | 1,697,500.00 | |
| | මාර්තු | 49 | 1,249,200.00 | |
| | අප්‍රේල් | 29 | 1,672,750.00 | |
| | මැයි | 13 | 2,340,500.00 | |
| | ජූනි | 15 | 595,500.00 | |
| | ජූලි | 46 | 1,575,400.00 | 18,100.00 |
| | අගෝස්තු | 30 | 781,300.00 | |
| | සැප්තැම්බර් | 15 | 731,750.00 | |
| | ඔක්තෝම්බර් | 20 | 2,248,600.00 | |
| | නොවැම්බර් | 38 | 2,129,150.00 | |
| | දෙසැම්බර් | 32 | 886,960.00 | |
| මුළු එකතුව | | 356 | 16,772,860.00 | 35,600.00 |
| 2018,2019.2020,2021 වර්ෂයන්හි මුළු එකතුව | | | | 154,900.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, චාලි ගුණරත්න මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>මුද්දර ගාස්තු, උසාවි දඩ මුදල් ප්‍රාදේශීය සභාවට නොලැබී තිබූ අවස්ථාවක , ඉතිහාසයේ පළමු වතාවට එම මුදල් ප්‍රාදේශීය සභාවට ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ ගරු ආණ්ඩුකාරතුමාට විශේෂ ස්තූතියක් පුද කර ලිපියක් යැවීමට තීරණය විය.</u>

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

09. ආයතනයේ නිල ඇඳුම් දීමනාව හිමි නොවන පහත සඳහන් කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත රාජකාරි ඇඟයීමක් ලෙස කාර්යාල ඇඳුම් කට්ටල ලබාදීම සඳහා අවශ්‍යය අනුමැතිය ලබා ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| තනතුර | සංඛ්‍යාව | සාරි | ටී ෂර්ට් | බොටම් |
|---|---|---|---|---|
| ලේකම් | 01 | 01 | 01 | |
| සංවර්ධන නිලධාරි | 09 | 08 | 10 | 01 |
| පුස්තකාලයාධිපති | 01 | 01 | 01 | |
| තාක්ෂණ සේවා නිලධාරි කාන්තා | 01 | 01 | 01 | |
| කළමනාකරණ සේවා නිලධාරි | 09 | 08 | 10 | 01 |
| ආදායම් පරීක්ෂක කාන්තා | 01 | 01 | 01 | |
| පරිගනක ක්‍රියාකරු | 01 | 01 | 01 | |
| පෙරපාසල් ගුරු | 13 | 13 | 13 | |

| | | | | |
|---|---|---|---|---|
| ආයුර්වේද ඖෂධ සංයෝජක | 01 | | 01 | 01 |
| කාර්මික නිලධාරි සහයක | 01 | | 01 | 01 |
| වාහන සේදුම්කරු | 02 | | 03 | 02 |
| විදුලි කාර්මික | 02 | | 02 | 02 |
| ආදාහනාගාර භාරකරු | 01 | | 01 | 01 |
| පැස්සුම්කරු | 01 | | 01 | 01 |
| වැඩ ක්ෂේත්‍ර කම්කරු (අනියම්) | 02 | 02 | 02 | |
| එකතුව | | 36 | 49 | 10 |

ඉහත ද්‍රව්‍ය වර්ෂය පුරා භාවිතයට ගත හැකි වන පරිදි පහසුවෙන් පිරිසිදු කලහැකි, ඉහල ගුණාත්මක තත්ත්වයේ ද්‍රව්‍ය වලින් යුතු අමුද්‍රව්‍ය වලින් සකස් කරන ලද ඒවා ලබා ගැනීමට අනුමැතිය ලබා දෙන මෙන්ද මෙම ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.**
**එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

10. ආයතනයේ ගබඩාව සඳහා 2023 වර්ෂයට පහත ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| **කර්මාන්ත උපකරණ** | |
|---|---|
| නො 12 වෙල්ඩින් කූරු කිලෝග්‍රෑම් | 60 |
| නො 10 වෙල්ඩින් කූරු කිලෝග්‍රෑම් | 60 |
| සිස්ටරින් පිටින් ෂෙට් | 04 |
| 1 1/2” ඉබි යතුරු කට්ටල | 20 |
| 2” ඉබි යතුරු කට්ටල | 20 |
| 3” ඉබි යතුරු කට්ටල | 20 |
| 2” කොන්ඩි පට්ටම් | 20 |
| 3” කොන්ඩි පට්ටම් | 20 |
| 6” කොන්ඩි පට්ටම් | 10 |
| 14” කටර් ප්ලේට් | 20 |
| 4 1/2” කටින් වීල් | 100 |
| 4 1/2” ග්‍රයින්ඩර් වයර් බ්‍රෂ් | 10 |
| | |
| **ලිපි ද්‍රව්‍ය** | |
| නිල් පෑන් | 850 |
| පාට A4 500 පැකට් (වර්ණ 5 කින් ලා පැහැති ) | 10 |
| හාෆ්ෂීට් පැකට් | 40 |
| රෝනියෝ ෂීට් පැකට් | 10 |

| | |
|---|---|
| ලීගල් පැකට් | 20 |
| A4 පැකට් | 200 |
| CR i පොත් | 40 |
| CR ii පොත් | 40 |
| CR iii පොත් | 40 |
| CR iv පොත් | 40 |
| CR v පොත් | 40 |
| CR vi පොත් | 25 |
| CR x පොත් | 20 |
| බ්‍රයින්ඩින් ෂීට් කළු | 100 |
| බ්‍රයින්ඩින් ෂීට් ට්‍රාන්ස්පේරන්සි | 100 |
| කුඩා කතුරු | 20 |
| 6”x3 1/2” ලිපි කවර | 2000 |
| 9”x4” ලිපි කවර | 6000 |
| 10”x7” ලිපි කවර | 2000 |
| 10”x15” ලිපි කවර | 1500 |
| අල්පෙනෙති පැකට් | 24 |
| ෆයිල් කටු පැකට් | 24 |
| දියර ගම් 200g තුඩ සහිත ගම් පෑන් | 30 |
| දියර ගම් 100g තුඩ සහිත ගම් පෑන් | 30 |
| ස්ටේප්ලර් කටු පෙට්ටි 369 (24/6) | 100 |
| තීන්ත පෑඩ් | 10 |
| ෆයිල් ටැග් | 6000 |
| ෆයිල් කවර | 600 |
| සිදුරු හතරෙ සණකම වැඩි ලිපිගොණු කවර | 50 |
| ලිපි ශීර්ෂ | 20000 |
| පොදු 35 සභා වවුචර් | 20000 |
| 1” සෙලෝටේප් 100m | 20 |
| 2” සෙලෝටේප් 100m | 40 |
| හයිලයිට් පෑන් වර්ණ කිහිපයකින් | 40 |
| MQ 5949 ටෝනර් | 06 |
| ටොෂිබා 2309A ටෝනර් | 10 |
| 278A ටෝනර් | 12 |
| 285A ටෝනර් | 30 |
| ජොලිමාක් 350 රිබන් | 05 |
| LQ 2190 රිබන් | 06 |
| MFC - L 27150(2480) බ්‍රදර් ටෝනර් | 02 |
| 1666 ටෝනර් | 05 |
| ක්ෂේත්‍ර සටහන් පොත් පිටු 80 | 40 |
| පැටිග්නම් රතු | 12 |
| පැටිග්නම් 12 පැකට් | 03 |

| | |
|---|---|
| 9 1/2"x11" කාබන් පිටපත සහිත පරිගනක ෂීට් පැකට් | 02 |
| 9 1/2"x11" කාබන් පිටපත රහිත පරිගනක ෂීට් පැකට් | 10 |
| 15"x11" කාබන් පිටපත රහිත පරිගනක ෂීට් පැකට් | 02 |
| අඩිකෝදු ප්ලාස්ටික් | 36 |
| වයිට්බෝඩ් මාර්කර් පෑන් (නිල් රතු කළු) | 36 |
| පර්මනට් මාර්කර් පෑන් | 12 |
| AAA බැටරි | 50 |
| AA බැටරි | 50 |
| පංචර් | 10 |
| ස්ටේප්ලර් මැෂිං ලොකු | 10 |
| කැල්කියුලේටර් | 10 |
| UPS | 04 |
| ටිපෙක්ස් | 20 |
| ස්ටික් නෝට් පැකට් | 100 |
| ග්ලු ස්ටික් | 30 |
| | |
| **ජල උපකරණ** | |
| සබන් කැට | 1000 |
| ටයිල් ක්ලීනර් 500ml බෝතල් | 30 |
| ටයිල් ක්ලීනර් 4l කෑන් | 05 |
| ප්ලාස්ටික් කොසු | 40 |
| එයාර් ප්‍රෂ්නර් | 12 |
| ග්ලාස් ක්ලීනර් | 12 |
| තණකොල කපන මැෂිං ප්ලග් | 20 |
| තණකොල කපන මැෂිං තංගුස් රෝල් | 20 |
| තණකොල කපන මැෂිං ක්ලච් | 06 |
| තණකොල කපන මැෂිං නූල් බොබිං | 10 |
| තණකොල කපන මැෂිං ක්ලච් බෙල් ෂෙට් | 04 |
| තණකොල කපන මැෂිං | 02 |
| 1/2" ජල කරාම | 30 |
| 1/2" ග්‍රේට් වැල් | 10 |
| 1/2" වැල් සොකට් | 20 |
| 1/2" පෝෂස් සොකට් | 20 |
| 1/2" එල්බෝ | 30 |
| 1" සොකට් | 20 |
| 1" වැල් සොකට් | 10 |
| 1" එල්බෝ | 20 |
| 1" ග්‍රේට් වැල් | 05 |

| | |
|---|---|
| 2” සොකට් | 10 |
| 2” එල්බෝ | 10 |
| 2” බෙන්ඩ් | 10 |
| 2” ෆුට්වැල් | 05 |
| 2” බෝල්වැල් | 05 |
| 2” වැල් සොකට් | 15 |
| 1 1/2” වැල් සොකට් | 10 |
| 1 1/2” එල්බෝ | 10 |
| 1 1/2” සොකට් | 10 |
| 1 1/2” ගේට් වැල් | 05 |
| 1” ට්‍රෙඩ් සීල් | 30 |
| 1/2” ට්‍රෙඩ් සීල් | 20 |
| සවල් | 20 |
| ප්ලාස්ටික් පනිට්ටු | 05 |
| විල්බැරෝ (කොංක්‍රීට්) | 05 |
| ෆිනෝල් | 30 |
| විම් දියර 500ml | 20 |
| විම් කැට 400g | 20 |
| විම් කැට 200g | 20 |
| හාපික් 500ml | 80 |
| ඉදල් | 150 |
| ප්ලාස්ටික් තාච්චි | 20 |
| බූට්ස් ජෝඩු | 10 |
| අත් ආවරණ ජෝඩු (රබර් මිශ්‍ර කැන්වස්) | 500 |
| මල් ගස් කපන කතුරු | 04 |
| **විදුලි උපකරණ** | |
| ස්කෲ සෙරමික් හෝල්ඩර් | 300 |
| 2 pin සෙරමික් හෝල්ඩර් | 300 |
| LED 2 pin 12.5W බල්බ් | 500 |
| LED ස්කෲ 12.5W බල්බ් | 500 |
| තම්ලර් ස්විච් | 100 |
| වයරින් ටේප් (කහ රතු කොල නිල් ) | 100 |
| 13A ප්ලග් | 10 |
| **වාහන උපකරණ** | |
| 900x20 ටයර් | 02 |
| 90A බැටරි | 02 |
| 100A බැටරි | 02 |
| 120A බැටරි | 02 |

| අනු අංකය | ලිපිද්‍රව්‍ය විස්තරය | පොදු ආකෘති පත්‍රය | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | ඖෂධ දෛනික නිකුත් කිරීම. | | 03 |
| 02 | දෛනික වැටුප් ලේඛන | | 02 |
| 03 | ඖෂධ වැයවීම පිළිබඳ දෛනික වැටුප් | | 08 |
| 04 | නිවාඩු ලේඛන | | 02 |
| 05 | මිළ දී ගැනීම් ලේඛන | | 02 |
| 06 | ගබඩා ගිණුම් ලෙජරය | | 06 |
| 07 | සේවක ණය ලේඛන | | 01 |
| 08 | වරිපනම් බදුකුලී ලේඛන | | 10 |
| 09 | බදුකුලී ලේඛන | පී.එස්. 30(76 රීතිය) | 02 |
| 10 | තැන්පත් ලේඛන | | 01 |
| 11 | වෙනත් ආදායම් | පී.එස්. 12(125 රීතිය) | 02 |
| 12 | වැය ලේඛන | | 03 |
| 13 | වැටුප් ලේඛන | | 04 |
| 14 | කම්කරු වැටුප් ලේඛන | | 02 |
| 15 | බෙහෙත් තොග ලේඛන | | 07 |
| 16 | රෝගී පැමිණිමේ ලේඛන | | 05 |
| 17 | යවන ලිපි ලේඛන | | 05 |
| 18 | ලැබෙන ලිපි ලේඛන | | 02 |
| 19 | මාසික වැටුප් ලේඛන (කම්කරු දින සටහන්) | | 05 |
| 20 | වෙළඳ ව්‍යාපාර බදු ලේඛන , කඩකුලී ලේඛන | | 0 |
| 21 | පුස්තකාල තැන්පත් ලේඛන | | 02 |
| 22 | මුද්දර පොත් | | 01 |
| 23 | වෙළඳ බලපත්‍ර ලේඛන | | 05 |
| 24 | සෞඛ්‍ය 99 පොත් | | 10 |
| 25 | දෛනික ආදායම් ලේඛන ප්‍රාස/03 | | 60 |
| 26 | නඩත්තු පොත් | | 100 |
| 27 | ඉන්ධණ ඇණවුම් පොත් | | 50 |
| 28 | දෛනික ධාවන සටහන් | | 100 |
| 29 | නිවාඩු ඉල්ලුම් පත් | | 4000 |
| 30 | භාණ්ඩාගාර 66 | පොදු 125 අ | 300 |
| 31 | සංවර්ධන අවසර පත්‍ර ලබාගැනීම | | 02 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. සිසිර කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

11. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් මහසෙන්පුර ආදාහනාගාරයේ ආදාහන සිදු කිරීම වෙනුවෙන් 2023 වර්ෂය සඳහා ඇස්තමේන්තු කර ඇති මුදල වන රු. 2,600,000.00 න් අවශ්‍යතාවය මත ගැස් මිලදී ගැනීමටත්, අදාල බිල්පත් පියවීමටත් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

2022 වර්ෂයේ මේ දක්වා සත්‍ය වියදම - රු. 1,484,476.00

2022 වර්ෂයේ මේ දක්වා ආදාහන සිදු කිරීම වෙනුවෙන් ලද සත්‍ය ආදායම - රු. 1,021,500.00

මහසෙන්පුර ආදාහනාගාරයේ මෘත දේහ ආදාහනය කිරීම සඳහා යන වියදම් පිළිබඳ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව එය දැඩි ලෙස පාඩු ලබමින් ඉටු කරන සේවාවක් බව හඳුනා ගන්නා ලදී. එය පහත පරිදි වේ.

| | |
|---|---|
| මසකට අවම වශයෙන් ආදාහනය කරන මෘත දේහ ගණන | 24 |
| මෘත දේහ 24 ක් ආදාහනය සඳහා ගැස් වැය වන ප්‍රමාණය | 874 kg |
| එක් ආදාහනයක් සඳහා වැය වන ගැස් බර kg | 23.3 kg |
| 37.5 kg ගැස් සිලින්ඩරයක මිළ | රු. 18,500.00 |
| මෘත දේහ ආදාහනය සඳහා ගැස් සඳහා මාසයකට යන ලද වියදම | රු. 431,050.00 |
| ආදාහනාගාර ක්‍රියාකරු, සහායක සඳහා වැටුප්, අතිකාල හා දීමනා මසකට | රු. 10,000.00 |
| මෘත දේහ 24ක් ආදාහනය සඳහා වන මුළු වියදම | රු. 441,050.00 |
| **එක් මෘත දේහයක් ආදාහනය සඳහා වන වියදම** | **18377.00** |

ඒ අනුව,

- ❖ තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වූ මෘත දේහයක් ආදාහනය කිරීම වෙනුවෙන් සභාව වෙත සිදුවන පාඩුව } 10000.00-18377.00

  රු. 8377.00

- ❖ තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත වූ මෘත දේහයක් ආදාහනය සිදු කිරීම වෙනුවෙන් සභාව වෙත සිදුවන පාඩු } 12000.00-18377.00

  රු. 6377.00

ඒ අනුව 2023 වර්ෂය සඳහා පහත පරිදි ගාස්තු සංශෝධනය සිදු කරන ලදී.

- ❖ තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වූ මෘත දේහයක් ආදාහනය කිරීම වෙනුවෙන් ගාස්තුව - රු. 18,400.00
- ❖ තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත වූ මෘත දේහයක් ආදාහනය කිරීම වෙනුවෙන් ගාස්තුව - රු. 20,000.00

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>අප ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් සඳහාත්, යාචකයින් සඳහාත් අදාළ ග්‍රාම නිලධාරී වාර්තාවන් ලබා ගෙන, ආදාහනාගාර සේවාව අප ආයතනය විසින් නොමිලයේ සිදු කර දීමට කටයුතු කර ඇති බව ප්‍රකාශ කරන ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

12. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සඳහා සකස් කරන ලද (www.tissamaharama.ps.gov.lk) වෙබ් අඩවිය 2022.10.01 දින සිට 2023.09.30 දක්වා වසරක කාලයකට අලුත් කිරීම වෙනුවෙන් නාවල පාර, නුගේගොඩ යන ලිපිනය සඳහන් PROCONS INFOTECH ආයතනය වෙත Invoice අංක PI2022291 යටතේ රු. 28,350.00 ක මුදල ගෙවීම් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.

✓ වෙබ් අඩවියක් මගින් සිදු වන්නේ කුමක්ද? එමගින් අප ආයතනයට තිබෙන ප්‍රයෝජන මොනවාද යන්න දැන ගැනීම සඳහා ගරු සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතාගේ සහ ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහා සභාව කාරක සභාවක් බවට පත් විය.

කාරක සභා අවස්ථාවේ ලේකම්තුමිය විසින් අදහස් දක්වමින්, අප ආයතනය සඳහා මීට පෙර වෙබ් අඩවියක් නොතිබුණි. ට්‍රාන්ස්පේරන්සි ශ්‍රී ලංකා ආයතනය විසින් අප ආයතනය තෝරා ගනිමින් අප ආයතනය සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර දීමට සහාය ලබා දුන් අතර, එහි පළමු වසර සඳහා වෙබ් අඩවිය වෙනුවෙන් මුදල් එම ආයතනය මගින් ගෙවීම් කළ බවත්, ඉදිරි වර්ෂයෙන් වර්ෂයට වෙබ් අඩවිය අලුත් කිරීම වෙනුවෙන් වන මුදල් අප විසින් ගෙවීම් සිදු කළ යුතු. එසේම ට්‍රාන්ස්පේරන්සි ආයතනය විසින් ග්‍රාමීය ජනතාවගේ අදහස් ලබා ගනිමින් අයවැය සකස් කිරීම, අවසන් ගිණුම් සකස් කිරීම හා වෙබ් අඩවිය පවත්වාගෙන යාම ආදී කරුණු සඳහා අප ආයතනය වෙත සහාය ලබා දී කටයුතු කර ඇත.

අප ආයතනයේ වෙබ් අඩවිය වෙත ගිය පසුව, අප ආයතනයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය, සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම, පොදු දැන්වීම්, අපගේ සේවාවන්, අප ආයතනය විසින් සිදු කරනු ලබන වැඩසටහන් ආදී තොරතුරු ඡායා රූප ද සමගින් බලා ගත හැකි බවත්, ඉදිරියේ මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ වරිපනම් බදු අය කිරීමට ද මෙම වෙබ් අඩවිය හරහා සිදු කිරීමට වැඩසටහනක් උක්ත ආයතනය විසින් ද සකස් කරන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>අප කාලය තුළ සිදු කරන සෑම කාර්යයක්ම නිවැරදිව විනිවිදභාවයෙන් යුතුව සිදු කරනු ලබයි. එය එසේ සිදු කිරීම වෙනුවෙන්ම අපගේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඕනෑම කෙනෙකුට දැන ගැනීම සඳහා වෙබ් අඩවියට ඇතුළත් කිරීමට මේ වන විටත් කටයුතු කර ඇති බව ප්‍රකාශ කර සිටින ලදී.</u>

✓ ගරු සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතාගේ සහ ආර්.කේ.එම්. රෝහිත මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව නැවත ගරු මහා සභාවක් බවට පත් විය.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

13. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාලය සඳහා පොත් මිලදී ගැනීම වෙනුවෙන් 2022 වර්ෂයේ වෙන් කර ඇති රු. 100,000.00 ක මුදලින් පුස්තකාලයට අදාළ පොත් මිලදී ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>පුස්තකාලය සඳහා රු. 100,000.00 ක මුදලින් පොත් මිලදී ගැනීමේ දී සාමාන්‍ය පෙළ/ උසස් පෙළ දරුවන්ට අවශ්‍ය අධ්‍යාපනික පොත් මිලදී ගැනීම සඳහා විශේෂ අවධානයක් යොමු කිරීම සුදුසු බව ප්‍රකාශ කර සිටින ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

14. 2022 වර්ෂය සඳහා සැප්තැම්බර්, ඔක්තෝම්බර්, නොවැම්බර් මාස සඳහා බදු සහන ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම් හා ආදායම් පරීක්ෂක වාර්තාද අනුව ලබා දෙන බදු සහන මුදල, ගරු මහා සභාවේ තීරණය කර බදු සහන ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

| අනු අංකය | දේපළ විස්තරය | මාසික බදු වාරික මුදල (රු) | සැප්තැම්බර්, ඔක්තෝබර්,නොවැම්බර් මාස සඳහා මුළු වාරික මුදල | කපා හැරීම සඳහා යොජනා කරන ලද මුදල 50% |
|---|---|---|---|---|
| 08 | තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ | 41,323.50 | 123,970.5 | 61,985.25 |
| 09 | කිරින්ද පූජා නගර රථවාහන නැවතුම්පොළ | 100,642.50 | 301,927.5 | 150,963.75 |
| | එකතුව | | 425,898 | 212,949.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා

පසුගිය වර්ෂයන් තුළ රට තුළ ඇති වූ යම් යම් අර්බුධකාරී තත්ත්වයන් නිසා, සභාවට ලැබිය යුතු ආදායම් ලබා ගැනීම අවම මට්ටමක පැවතුනද, 2023 වසරේ සභාවට ලැබිය යුතු සියලු ආදායම් ලබා ගැනීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කරමි. එම නිසා ඉහත කී දේපළයන් සඳහා ආදායම් පරීක්ෂක වාර්තා ලබා දී ඇති බැවින් 50% ක මුදලක් කපා හැරීම සුදුසු වන බව දන්වා සිටින ලදී.

❖ අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා

තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ සැප්තැම්බර් මස, 7,600.00 ක්, ඔක්තෝම්බර් මස රු. 8,130.00 ක්, නොවැම්බර් මස රු. 7,180.00 ක ප්‍රමාණයක ආදායමක් පමණක් ලැබී ඇති බව බදුකරු විසින් මා වෙත ප්‍රකාශ කරන ලදී. මේ නිසා බදු වාරිකය ගෙවා ගැනීමට පවා, නොහැකි ලෙසට ඉහත මාසයන්වල බදු අයවීම් සිදු නොවී ඇති බැවින්, මෙම දේපළ සඳහා අදාළ මාස 03 හි සත්‍ය ආදායම පිළිබඳව නොසිතා, මාස 03 හි වාරික මුදලින් 50% ක මුදලක් පමණක් කපා හැරීම ප්‍රමාණවත් නොවන බව ප්‍රකාශ කර සිටින ලදී.

✓ මේ සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු ලබා ගැනීම සඳහා ගරු සභික, ඒ.පී. ධම්මික මහතාගේ සහ ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහා සභාව කාරක සභාවක් බවට පත් විය.

කාරක සභා අවස්ථාව සඳහා කැඳවූ ආදායම් පරීක්ෂක නිලධාරී විසින් ප්‍රකාශ කරන ලද්දේ, තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ හි ආදායම් අයවීම් පිළිබඳව සතියේ දින කිහිපයක් අධීක්ෂණය කිරීමේ දී ඇතැම් දිනවල වාහන 02-03 පමණක් තිබූ බවත්, ඇතැම් දිනවල වාහන කිසිවක් නොතිබූ බවත්, තිස්සමහාරාමයට පැමිණෙන වාහන තිස්සමහාරාම පන්සල පිටුපස තිබෙන රථවාහන නැවතුම්පොළ මුදල් අය කිරීමකින් තොරව වාහන නවතා තැබීම සඳහා ලබා දී ඇති අතරම, එම ස්ථානය තුළ සනීපාරක්ෂක පහසුකම් සපයා තිබීම හේතුවෙන්, සියලුම රථවාහන එම ස්ථානයේ නවතා තබන බැවින්, තිස්සමහාරාම රථවාහන නැවතුම්පොළ සඳහා වාහන පැමිණීමේ අඩුවක් තිබෙන බව ප්‍රකාශ කරන ලදී.

ඉන් අනතුරුව තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ ආදායම් අඩු වීම සම්බන්ධයෙන් නිරීක්ෂණය කර ලබා ගන්නා ලද වාර්තාව ආදායම් පරීක්ෂක නිලධාරී විසින් මහා සභාව හමුවේ ප්‍රකාශ කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ සම්බන්ධයෙන් ආදායම් පරීක්ෂක නිලධාරී ලබා දී ඇති වාර්තාවන් ද ලබා ගෙන, මේ සම්බන්ධයෙන් පහතින් නම් කර පත් කරන ලද කමිටුව මගින් මේ පිළිබඳව සාකච්ඡා කර, වාර්තාවක් ලබා ගැනිමට මහා සභාවේ බලය පවරන අතර, එකී කමිටුව මගින් ලබා ගන්නා තීරණය සඳහා මහා සභාව එකඟ වන බවටත්, කමිටුව මගින් ලබා ගන්නා තීරණය නැවත මහා සභාවට ඉදිරිපත් කර යෝජනාව සම්මත කර ගැනීමටත් තීරණය විය.</u>

| | | |
|---|---|---|
| I. | ගරු උප සභාපති | - සුදත් විදාන ගමගේ මහතා |
| II. | ගරු ප්‍රාදේශීය සභා සභික | - කේ.එච්. ගාමිණී මහතා |
| III. | ගරු ප්‍රාදේශීය සභා සභික | - පී.කේ. ආරියසේන මහතා |
| IV. | ගරු ප්‍රාදේශීය සභා සභික | - ආර්. රජිත ප්‍රියදර්ශන මහතා |
| V. | ගරු ප්‍රාදේශීය සභා සභික | - ආර්.කේ.එම්. රෝහිත මහතා |
| VI. | ගරු ප්‍රාදේශීය සභා සභික | - ඒ.පී. ධම්මික මහතා |
| VII. | ගරු ප්‍රාදේශීය සභා සභික | - ඒ.ඩබ්. නන්දා මිය |
| VIII. | ලේකම් | - ඩී. රුවිනා දීපානි |
| IX. | ප්‍රජා සංවර්ධන නිලධාරී | - ටී.එච්. සචිත්‍රා ප්‍රසාදනි මිය |
| X. | ආදායම් පරීක්ෂක නිලධාරී | - එස්.ඒ. අරුෂි ප්‍රසංගිකා මිය |
| XI. | විෂය නිලධාරී | - වයි.ජී.එම්. නිරාෂා මිය |
| XII. | අදාළ බදුකරුවන් | |

✓ ගරු සභික, ඒ.පී. ධම්මික මහතාගේ සහ වැල්ලගේ ජීවානි මහත්මියගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව නැවත ගරු මහා සභාවක් බවට පත් විය.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

15. 2023 වර්ෂය සඳහා දේපල බදු දීම සඳහා ප්‍රසම්පාදන (ටෙන්ඩර්) දැන්වීම දිණමින, තිණකරන් හා ඩේලිනිවුස් පුවත්පත්වල 2022 සැප්තැම්බර් 26 දින පළ කිරීම වෙනුවෙන් ද ඇසෝසියේටඩ් නිවුස් පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් ආයතනයට රු. 82,110.00 ගෙවීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

    එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතා විසින් ස්ථිර කරන ලදී.
    එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

16. 2023 වර්ෂයේ තිස්සමහාරාම ප්‍රාදේශිය සභාවේ ප්‍රසම්පාදන කටයුතු සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට ත්‍රෛභාෂාවෙන් පුවත්පත් දැන්වීම දිනමිණ,තිනකරන්,ඩේලිනිවුස් දරණ පුවත්පත්වල 2022.10.28 දින පලකිරීම වෙනුවෙන් ද ඇසෝසියේටඩ් නිවුස් පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් ආයතනයට රු. 204,981.75 ගෙවීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

    එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, වාලි ගුණරත්න මහතා විසින් ස්ථිර කරන ලදී.
    එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

17. වර්පනම් විෂයට අදාල ලිපිගොනු කවර මිලදී ගැනීම වෙනුවෙන් සී/ස ගුණවර්ධන සහ (පෞද්) සමාගමට රු.75,000.00 ක මුදලක් ගෙවීමට සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

    එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.
    එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

18. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය අංශයේ සේවක මහත්ම මහත්මීන් සඳහා සැප්තැම්බර්, ඔක්තෝම්බර් සහ නොවැම්බර් මාස සඳහා දිවා ආහාරය ලබා දීම වෙනුවෙන් බිල්පත් අංක 001, 002, 006, 007 යටතේ රු. 109,520.00 ක මුදල සිසිල රෙස්ටුරන්ට් ආයතනය වෙත ගෙවීම් කිරීම සුදුසු සුදුසු බවට මෙම ගරු සභාව යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ජී. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

19. පහත සඳහන් වාහන අලුත්වැඩියාවන් සිදු කර ඇති අතර, ඒ සඳහා ගෙවීම් කිරීමට අදාළ අනුමැතිය සඳහා මහා සභාවට යොමු කරමි.

<u>රු. 50000.00 ට වඩා වටිනාකමින් යුතු වාහන අලුත්වැඩියාවයට අදාළ බිල්පත් පියවීම.</u>

| | වාහන අංකය | අලුත්වැඩියාව | ආයතනය | බිල්පත් අංකය-දිනය | මුදල |
|---|---|---|---|---|---|
| 01 | ZB – 0413 කම්පැක්ටර් රථය | පූර්ණ සේවා කිරීම | රෝහණ ඔටෝ සර්විස් | 353 / 22.11.22 | 70250.00 |
| 02 | LM – 5616 කම්හැක්ටර් රථය | ඇම්පියර් 90 බැටරි 02 ක් සැපයීම | තිසර ට්‍රේඩර්ස් | 2432 / 22.12.08 | 92000.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

20. 2023 වර්ෂය සඳහා සකස් කරන ලද රැස්වීම් කාල සටහන සභා ගත කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

**2023 වර්ෂයේ රැස්වීම් කාල සටහන**

**තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව**

| අනු අංකය | රැස්වීම | පැවැත්වෙන වේලාව | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝම්බර් | නොවැම්බර් | දෙසැම්බර් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | මාසික සභා රැස්වීම | පෙ.ව. 09.30 | 19 | 14 | 16 | 10 | 18 | 15 | 13 | 17 | 14 | 19 | 16 | 07/ 21 |
| 02 | මුදල් ප්‍රතිපත්ති කාරක සභාව | ප.ව. 2.30 | 04 | 03 | 02 | 03 | 04 | 02 | 04 | 03 | 05 | 05 | 02 | 05 |
| 03 | කාර්මික සේවා කාරක සභාව | පෙ.ව. 9.30 | 04 | 03 | 02 | 03 | 04 | 02 | 04 | 03 | 05 | 05 | 02 | 05 |
| 04 | නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව | ප.ව. 01.00 | 04 | 03 | 02 | 03 | 04 | 02 | 04 | 03 | 05 | 05 | 02 | 05 |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 05 | පරිසර හා පහසුකම් කාරක සභාව | පෙ.ව. 11 | 04 | 03 | 02 | 03 | 04 | 02 | 04 | 03 | 05 | 05 | 02 | 05 |
| 06 | තාක්ෂණික ප්‍රගති සමාලෝචන කමිටුව | ප.ව. 04.15 | 09 | 10 | 07 | 06 | 06 | 08 | 05 | 05 | 05 | 06 | 03 | 06 |
| 07 | සැලසුම් කමිටුව | ප.ව. 04.15 | 12/26 | 10/24 | 09/23 | 11/25 | 10/24 | 06/22 | 07/21 | 09/23 | 13/27 | 11/25 | 08/22 | 13/27 |
| 08 | සංවර්ධන උපදේශන කමිටුව | පෙ.ව. 10.30 | 25 | 24 | 28 | 26 | 23 | 28 | 28 | 25 | 27 | 27 | 24 | 29 |
| 09 | කළමනාකරණ කමිටුව | පෙ.ව. 11.00 | 26 | _ | 30 | _ | 26 | _ | 26 | _ | 26 | _ | 22 | _ |
| 10 | පොළ කමිටුව | ප.ව. 02.00 | _ | 22 | _ | 26 | _ | 27 | _ | 21 | _ | 25 | _ | 27 |
| 11 | පුස්තකාල උපදේශන කමිටුව | ප.ව. 03.00 | 23 | 23 | 29 | 27 | 30 | 28 | 26 | 27 | 27 | 27 | 24 | 29 |
| 12 | කාර්ය මණ්ඩල රැස්වීම | ප.ව. 02.00 | 12 | 09 | 10 | 18 | 11 | 08 | 11 | 10 | 12 | 13 | 17 | _ |
| 13 | ආදායම් කමිටුව | පෙ.ව. 10.00 | _ | 23 | _ | 25 | _ | 27 | _ | 28 | _ | 26 | _ | 28 |
| 14 | විගණන කමිටුව | පෙ.ව. 09.30 | _ | _ | 21 | _ | 25 | _ | _ | _ | 22 | _ | 21 | _ |

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

21. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මගින් දෛනික පදනම මත සේවයේ යොදවා ගන්නා කම්කරුවන් 10 ක් හා රියදුරන් 05 කගේ සේවා කාලය සේවා අවශ්‍යතාවය මත 2023.01.01 දින සිට 2023.06.30 දක්වා ඉදිරියට මාස 06 ක් සඳහා දීර්ඝ කර ඔවුන් වෙත සභා අරමුදලින් දෛනික පදනම මත දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටු මිල ගණන් යටතේ වැටුප් ගෙවීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. සිසිර කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

22. ප්‍රජා සංවර්ධන විෂයට අදාළ 2023 වර්ෂය සඳහා ප්‍රජා සංවර්ධන අංශයේ වාර්ෂික සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>වාර්ෂික සැලැස්ම 2023 - ප්‍රජා සංවර්ධන අංශය</u>**

| අනු අංකය | ක්ෂේත්‍රය | වැඩසටහන |
|---|---|---|
| 01 | පෙර පාසල් | පෙර පාසල් සඳහා නවක දරුවන් ඇතුළත් කර ගැනීම |
| | | වාර්ෂික පෙර පාසල් ලේඛනගත කිරීම |
| | | නිදහස් දින උළෙල පැවැත්වීම |

| | | |
|---|---|---|
| | | ගුරු පුහුණු වැඩසටහන් |
| | | පෙර පාසල් අවුරුදු උත්සවය |
| | | වෙසක් සැමරුම් වැඩසටහන් |
| | | පොසොන් උත්සව වැඩසටහන් |
| | | නව පෙර පාසල් දහයක් සභාවට පවරා ගෙන ආරම්භ කිරිම |
| | | පෙර පාසල් දරුවන් සඳහා පෝෂ්‍යදායි ආහාර ලබා දීමේ වැඩසටහන |
| | | පෙර පාසල් දරුවන් සඳහා නිල ඇඳුම් ලබා දීම |
| | | ළමා හා වැඩිහිටි දිනය සැමරීම |
| 02 | පුස්තකාල | පුවත්පත් සහ පොත් මිළදී ගැනීම |
| | | සාහිත්‍ය මාසය හා කියවීම් මාසය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම |
| | | පුස්තකාලය උපදේශන කමිටු හා පාඨක සමාජ රැස්වීම් |
| 03 | ආයුර්වේද | ආයුර්වේද ඖෂධ මිලදී ගැනීම |
| | | ආයුර්වේද සායන පැවැත්වීම |
| 04 | ආදාහනාගාර හා සුසානභූමි | සියළු සුසාන භූමි සභාවට පවරා ගැනීම හා මැනුම් කටයුතු කර නිරවුල් කර ගැනීම සඳහා සභාවේ අවධානය යොමු කරවීම |
| 05 | ක්‍රීඩා භූමි | සියලු ක්‍රීඩා පිටි සභාවට පවරා ගැනීම හා මැණුම් කටයුතු කර නිරවුල් කර ගැනීම සඳහා සභාවේ අවධානය යොමු කරවීම |
| 06 | පොදු | නගර අලංකරණ කටයුතු |
| | | වටරවුම් අලංකරණය |
| | | සෞඛ්‍ය වැඩසටහන් පැවැත්වීම |
| | | ක්‍රීඩා සමාජ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම |
| | | ආපදා කළමනාකරණ කටයුතු |
| | | කාන්තා හා ළමා අභිවෘද්ධි වැඩසටහන් පැවැත්වීම |
| | | වෙසක් හා පොසොන් උත්සව කටයුතු පැවැත්වීම |
| | | දිළිඳු පවුල් සඳහා වැසිකිළි ඉදිකර දීමට සහාය දැක්වීම |

| | | |
|---|---|---|
| | | ස්ථාපිත කරන ලද ජල බුලි සඳහා ජලය සැපයීම |
| | | ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

23. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාර සඳහා 37.5 Kg ගෑස් සිලින්ඩර් 24 ක් මිලදී ගැනීම වෙනුවෙන් බිල් අංක 290530, 289932, 292966, 293814, 294957 යටතේ රු. 434,100.00 ක මුදල සෝමසිරි ස්ටෝර්ස් (අගුණුකොළපැලැස්ස) වෙත ගෙවීම් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

24. 2023 වර්ෂයේ ප්‍රසම්පාදන මණ්ඩර් මණ්ඩලය සඳහා පහත සාමාජිකයින් පත් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| | | |
|---|---|---|
| I. | ගරු සභාපති | - ඩබ්ලිව්.ජී. උපුල් මහතා |
| II. | ගරු උප සභාපති | - සුදත් විදානගමගේ මහතා |
| III. | ගරු ප්‍රාදේශීය සභා සභික | - ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා |
| IV. | ගරු ප්‍රාදේශීය සභා සභික | - කේ.එච්. ගාමිණී මහතා |
| V. | ලේකම් | - ඩී. රුවිනා දීපානි මිය |
| VI. | තාක්ෂණ සේවා නිලධාරී | - එල්.පී. ජගත් කුමාර මහතා |
| VII. | සංවර්ධන නිලධාරී | - වයි.ජී.එම්. නිරාෂා මිය |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

25. ප්‍රාදේශීය සභාවේ කාර්යයන් හා කර්තව්‍යයන් සඳහා කරන ලද රු. 50,000.00 ට වඩා වැඩි වැය කිරීම් සඳහා ගෙවීම් කිරීමට ඉදිරිපත් වූ පහත උපලේඛනයේ සඳහන් බිල්පත් වෙනුවෙන් ගෙවීම් අනුමැතිය ලබා දීමට මෙම ගරු සභාව යෝජනා කරමි.

<u>උප ලේඛනය</u>

රු. 50,000.00 ඉක්මවන ගෙවීම් විස්තරය

| අනු අංකය | විස්තරය | ගෙවනලද/ගෙවීමට ඇති ආයතනය | බිල්අංකය සහ දිනය | මුදල (රු.) |
|---|---|---|---|---|
| 01 | තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් තිස්සමහාරාම, යෝධකන්ඩිය ආයුර්වේද මධ්‍යස්ථානය සඳහා ඖෂධ මිලදී ගැනීම | ශ්‍රී ලංකා ආයුර්වේද සංස්ථාව | 7ICR012821<br>7ICR012819 | 149,978.00<br>150,000.00 |
| 02 | වරිපනම් විෂයට අවශ්‍ය ලිපි ගොණු කවර මිලදී ගැනීම | සී/ස ගුණවර්ධන සහ (පෞද්) සමාගම | 38346 | 75,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 03 | අයතනයේ ගබඩාව සඳහා රබර් මිශ්‍ර කැන්වස් අත් මේස් ජෝඩු 500, හාෆ් ෂීට් පැකට් 20, රෝනියෝ ෂීට් පැකට් 20, සබන් කැට 1000 මිලදී ගැනීම | සී/ස ගුණවර්ධන සහ (පෞද්) සමාගම | 38491 | 307,000.00 |
| 04 | RD-8051 ට්‍රැක්ටරයේ වහල සකස් කිරීම | යසිදු ප්ලාස්ටික් ඇන්ඩ් මෙට්‍රල්ස් | 1261 | 36,873.00 |
| 05 | කාර්යාලයේ මුද්‍රණ යන්ත්‍ර සඳහා ටෝනර් 02 ක් මිලදී ගැනීම | මෙගා කම්පියුටර්ස් | 671 | 21000.00 |
| 06 | කාර්යාලයේ ගබඩාව සඳහා වෙල්ඩින් කූරු නො. 10 - කි.ග්‍රෑ 20, නො. 12 - කි.ග්‍රෑ 20 | යසිදු ප්ලාස්ටික් ඇන්ඩ් මෙට්‍රල්ස් | 1264 | 33,000.00 |
| 07 | අයවැය-2023 පොත් මුද්‍රණය සඳහා ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | සී/ස ගුණවර්ධන සහ (පෞද්) සමාගම | 38421<br>38462 | 7,000.00<br>17,500.00 |
| 08 | PF-7365 අංක දරණ කැබ් රථය පූර්ණ සේවා කිරීම | රෝහණ ඔටෝ සර්විස් | 367<br>2022.12.08 | 37,905.00 |
| 09 | LL-7379 ගලි බවුසරයේ බෙල්ට් ඉවත් කර අලුතින් යෙදීම | අරියපොල ඔටෝ ඉංජිනියර්ස් | 7980<br>2022.1208 | 13,000.00 |
| 10 | යාන්ත්‍රික වැඩපල සඳහා ග්‍රීල් 01 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | කොඩිතුවක්කු මෝටර්ස් ට්‍රේඩර්ස් | 3455 | 6,950.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

- ❖ **<u>රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා</u>**
- **<u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

26. සඳුන්ගම බෙරලිහෙල මාර්ගය, ඇල්ලගල ඇනිකට් එක අසල සිට මහින්දපුර පන්වල හන්දිය දක්වා මාර්ගය, වැල්ලවාය ප්‍රධාන මාර්ගයේ සිට දඹේවැලැන සුසාන භූමිය දක්වා බොරලු මාර්ගය, දඹේවැලැන සුසාන භූමිය අසල සිට සඳුන්ගම මාර්ගය, දඹේවැලැන සුසාන භූමිය අසල සිට විජිතපුර බුදු මැදුර අසල සිට දෙබරවැව වතුර ටැංකිය දක්වා මාර්ගය, වැල්ලවාය ප්‍රධාන මාර්ගයේ සිට ආලෝක මාවත පන්නෙගමුව මදච්ච දක්වා මාර්ගය, දෙබරවැව පාළම අසලින් ඇති කිරිදි නදී මාවත මෝලකැපුපතාන තිස්ස මාතර ප්‍රධාන මාර්ගය දක්වා මාර්ගය, දෙබරවැව ජාතික පාසල පිටුපසින් යකඩ පාළම දක්වා මාර්ගය, තිස්සමහාරාම සේනානායක මාවත රබර්වත්ත පාර සිට කිරින්ද මාර්ගය දක්වා මාර්ගය, ඇල්ලගල 02 පෙළ මාර්ගය ඇල්ලගල සමුපකාර ගොඩනැගිල්ල දක්වා මාර්ගය යන මාර්ග කාපට්, තාර යොදා ඇති මාර්ග වන බැවින්, මෙම මාර්ග දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා දීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>ඉහත යෝජනාවට ඇතුළත් කර ඇති මාර්ගවලට අමතරව කොට්ඨාසවල පවතින කාපට් මාර්ග පවතින්නේ නම් එකී මාර්ග ලබා දුන් පසු, මාර්ග සංවර්ධන අධිකාරියට පවරා දීමට අවශ්‍ය අනුමැතීන් ලබා ගත හැකි බව ප්‍රකාශ කරන ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

27. තිස්සමහාරාම බල ප්‍රදේශයේ පිහිටි ග්‍රාම සේවා වසම් 44 හි දිළිඳු පවුල්වල අධ්‍යාපනය ලබන දරුවන් සඳහා සභා අරමුදලින් රු. 300,000.00 ක මුදලක් යොදා ගනිමින් පාසල් පොත් සහ පාසල් උපකරණ (පාසලේ විදුහල්පතිගේ ලිපිය සහ ග්‍රාම නිලධාරී සහතික කරන ලද ලිපි සමඟ) 2023 වර්ෂය සඳහා ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>ඉහත යෝජනාවේ සඳහන් මුදලින් මෙම කාර්යය සාර්ථකව සිදු කර ගැනීමට මුදල් ප්‍රමාණවත් නොවන බැවින්, මෙකී පොත් ලබා ගැනීම සඳහා සභා අරමුදලින් රු. 500.000.00 ක මුදලක් වෙන් කිරීම සුදුසු බවට මෙම යෝජනාව සංශෝධනය කිරීමට තීරණය කරන ලදී.</u>

❖ <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා</u>

<u>මෙම සමාජ සත්කාරය සඳහා පරිත්‍යාගශීලීන් සම්බන්ධ කර ගැනීමට හැකි නම්, මෙම කාර්යය තවත් සාර්ථකව සිදු කර ගත හැකි බවත් ප්‍රකාශ කරන ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

28. හොඳහිත ව්‍යාපාර පුද්ගලි සමාගම සතු අංක 215, පන්නෙගමුව පාර, තිස්සමහාරාම යන ස්ථානයේ පිහිටි හොඳ හිත සිතුවිලි මන්දිරයට අයත් හොඳ හිත නෙළුම් බුදු කුළුණ විදේශ සංචාරකයින්ට පමණක් නැරඹීම සඳහා ඩොලර් 03 ක් වැනි ප්‍රවේශ පත්‍රයක් විදේශිකයන්ගෙන් එම ආයතනය විසින් අය කිරීමට අදහස් කරන බව තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව වෙත දැනුම් දී ඇත. ඒ අනුව, 1946 අංක 12 දරණ විනෝද බදු ආඥා පනතට අනුව සහ තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව විසින් 2021.10.15 දින දරණ 2250 අංක දරණ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද තීරණයට අනුව එම ඩොලර් 03 ක මුදලින් 20% ක විනෝද බදු මුදලක් තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව වෙත අය කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>අප ආයතනයට ලැබිය යුතු 3% ක මුදල ඩොලර්වලින්ම ලබා ගත යුතුය. සභාවට ආදායමක් ලබා දීම වෙනුවෙන් හොඳ හිත නෙලුම් කුළුණ අධිපති විසින් සිදු කරන්නාවූ කාර්යයට එතුමන්ට ස්තූති පූර්වක ලිපියක් යොමු කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

29. 2008 වර්ෂයේ දකුණු පළාත් සංවර්ධන සැලැස්මේ මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ප්‍රාදේශීය සභාවේ තරුණ කටයුතු සඳහා පොදු සේවා මධ්‍යස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් ලද රු. 1,500,000.00 කින් රු. 563,997.00 ක් වැය කර තිබු අතර, ඉතිරි මුදල ආපසු දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශ වෙත ආපසු යැවීමට කටයුතු කරන ලෙස විගණන විමසුම් මගින් පෙන්වා දී ඇති නමුත්, ඉතිරි මුදල ආපසු යැවීම වෙනුවට එම මුදලින් අදාළ ව්‍යාපෘතියේ වැඩ නිම කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>විගණකාධිපති එවා ඇති විගණන විමසුම සමඟින්ම මේ සඳහා පිළිතුරක් යොමු කිරීම සුදුසු බව දන්වා සිටින ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

30. 2023 වර්ෂය සඳහා ප්‍රසම්පාදන ටෙන්ඩර් තෙවනවර දැන්වීම අනුව පහත දේපල සඳහා ටෙන්ඩර් දේපල 05 ටෙන්ඩර් කැඳවිමේදී දේපල 02 ක් සඳහා ටෙන්ඩර් අයදුම්පත්‍ර ලැබී තිබුණි.

ඒ අනුව,

| අනු අංකය | බදු විෂයය | අවම ලන්සුව (රු) | ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප මුදල (රු) | පෝරම් ගාස්තුව (රු) |
|---|---|---|---|---|
| 01 | කිරින්ද පූජා නගර රථවාහන නැවතුම්පොළ | 1,086,939.00 | 10,000.00 | 500.00 |
| 02 | දෙබරවැව ධීවර වෙළඳසැල | 108,000.00 | 1,000.00 | 500.00 |
| 03 | දෙබරවැව පොදු වෙළදපොළ ධීවර ගොඩනැගිල්ල | 145,800.00 | 1,000.00 | 500.00 |
| 04 | අකුරුගොඩ හන්දියේ වැසිකිළිය | 2,851.20 | 1,000.00 | 500.00 |
| 05 | තිස්සමහාරාම මාගම අක්කර 18 පොල් එළදාව (පොල් ගස් 07) | 2,025.00 | 1,000.00 | 500.00 |

- කිරින්ද පූජා නගර රථ වාහන නැවතුම්පොළ හා අකුරුගොඩ හංදිය කඩ කාමර අසල වැසිකිළිය සඳහා ටෙන්ඩර් අයදුම්පත්‍ර 02ක් ලැබී තිබු අතර කිරින්ද පූජා නගර රථ වාහන නැවතුම්පොළ සඳහා තිස්සමහාරාම, කිරින්ද, සුදුගල පාර,අංක 139 ලිපිනයෙහි ලිපිනයෙහි පදිංචි එදිරිවර්ණ පටබැදිගේ ටමේෂ් නිර්මාල් මහතා විසින් 1096939.00 ක(රුපියල් දසලක්ෂ අනූ හය දහස් නමසිය තිස් නමයක්) වටිනා ටෙන්ඩරය ඉදිරිපත් කර තිබු අතර එය අවම ලංසු මුදලට වඩා වැඩි අගයක් බැවින්ද, එම දේපළ සඳහා වෙනත් අයදුම්කරුවකු ඉදිරිපත් වී නොතිබූ බැවින්ද අදාල ටෙන්ඩරය ඔහු වෙත පිරිනැමීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.
- අකුරුගොඩ හංදිය කඩකාමර අසල වැසිකිළිය සඳහා පුල්පල්ලම, රන්මිණිතැන්න, කු.ග 08, නො 31හි ලිපිනයෙහි පදිංචි අමරසේන අංගප්පුලි මහතා විසින් රු 2900.00ක (දෙදහස් නමසියයක්) වටිනා ටෙන්ඩරය ඉදිරිපත් කර තිබු අතර එය අවම ලංසු මුදලට වඩා වැඩි අගයක් බැවින්ද, එම දේපළ සඳහා වෙනත් අයදුම්කරුවකු ඉදිරිපත් වී නොතිබූ බැවින්ද අදාල ටෙන්ඩරය ඔහු වෙත පිරිනැමීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.
- තවද, ටෙන්ඩර් නොවූ පහත දේපල සඳහා දැනට ටෙන්ඩරය ලබා දී ඇති ටෙන්ඩර් කරුවන් වෙත තෙවන වර අවම ලංසු මුදලට ඉල්ලීම් ලිපි මගින් ලබා දීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය කරන ලදී.
    1. දෙබරවවැව ධිවර වෙළඳ සැල
    2. දෙබරවැව පොදු වෙළඳ පොළ ධිවර ගොඩනැගිල්ල
    3. තිස්සමහාරාම මාගම අක්කර 18 පොල් එළදාව

ඉහත ටෙන්ඩර් මණ්ඩල තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

31. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් ස්ථාන වල පිහිටි කඩ කාමරයේ බදු අයිතිය පහත පරිදි සංශෝධනය කිරීම සුදුසු බවට ගරු සභාව වෙත යෝජනා කරමි.

| අනු අංකය | ස්ථානය | කඩ කාමර අංකය | දැනට බදු අයිතිය | පැවරීම | සම්බන්ධය |
|---|---|---|---|---|---|
| 1 | තිස්සමහාරාම නගර සභා කඩ කාමරය | 10 | කේ.එච්. ඇඩ්වින් සිල්වා | කේ.එච්. සිසිර | පියාගෙන් පුතාට |
| 2 | තිස්සමහාරාම පොදු වෙලඳපොළ කඩ බක්කිය | 15 | ඩබ්.සිරිපාල | කේ.ජී. කාන්ති | ස්වාමියාගෙන් බිරිඳට |
| 3 | තිස්සමහාරාම බස්නැවතුම්පොළ ඉදිරිපිට නව කඩ කාමරය | 08 | ජී.ජී. උදාර දේශප්‍රිය | කේ.ඩබ්. ප්‍රියමාලී මනෝජිකා | එක්වන් මුදල ගෙවා |
| 4 | තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ 2 පියවර මල් කඩ කාමරය | 02 | ඒ.පී. අමරසේන | ඒ.පී. ජීවන් උදය කුමාර | පියාගෙන් පුතාට |
| 5 | තිස්සමහාරාමනව වෙලඳ සංකීර්ණය දෙමහල | 19 | විදාන ගමගේ ඉරංග අජින්ද | විරිත්තමුල්ල ගමගේ ජේමාවතී | එක්වන් මුදල ගෙවා |

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

32. 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය සඳහා සාමාජිකයින් 2022.11.17 වන දින පැවැති මහා සභාවේ යෝජනා අංක 08 යටතේ පත් කරන ලද අතර, එහි සාමාජික ලෙස නම් කර ඇති සඳුනි නරසිංහගේ මහත්මිය වෙනුවෙට ආර්.කේ. චමිලා මධුවන්ති මහත්මිය පත් කිරීමටත්, විමර්ශන නිලධාරී ලෙස පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ විමර්ශන නිලධාරී, රත්නසිරි මහතා පත් කිරීම සුදුසු බවටත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

33. රට තුල පවතින තත්ත්වය තුල ගෑස් සහ ඉන්ධන ඇතුළු අනෙකුත් භාණ්ඩවල මිල සීඝ්‍රයෙන් ඉහල යාම හේතුකරගෙන 2022 වර්ෂය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන වසර අවසන් වීමට ප්‍රථම අවසන් වී ඇති බැවින් ඉදිරි මාස 1 ½ කාලය සඳහා වියදම් දැරීමට අවශ්‍ය ඇස්තමේන්තුගත වියදම් හා ඇස්තමේන්තුගත ආදායම් අනුමත කර ගැනීම සඳහා 2022.11.17 දින පැවැති මහා සභාව මගින් අනුමත කරන ලද ආදායම් වියදම් ඇස්තමේන්තුව පහත පරිදි සංශෝධනය කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ආදායම් ඇස්තමේන්තුව**

| අය විෂය සංකේතය | අය විෂය නාමය | ඇස්තමේන්තු මුදල (රු.) |
|---|---|---|
| 1-63 | මුද්දර ගාස්තු | 3,900,000.00 |
| 2-31 (1%) | වෙළඳ බලපත්‍ර (1%) | 2,000,000.00 |
| | | |
| | | 5,900,000.00 |

**වියදම් ඇස්තමේන්තුව**

| වැය විෂය සංකේතය | වැය විෂය නාමය | ඇස්තමේන්තු මුදල (රු.) |
|---|---|---|
| 103-2 | ඉන්ධන හා ස්නේහක තෙල් | 780,000.00 |
| 203-2 | ඉන්ධන හා ස්නේහක තෙල් | 1,535,000.00 |
| 303-2 | ඉන්ධන හා ස්නේහක තෙල් | 500,000.00 |
| 503-2 | ඉන්ධන හා ස්නේහක තෙල් | 200,000.00 |
| 603-2 | ඉන්ධන හා ස්නේහක තෙල් | 300,000.00 |
| 203-8-1 | ගෑස් මිලදී ගැනීම | 400,000.00 |
| 103-8 | වෙනත් ගබඩා භාණ්ඩ | 100,000.00 |
| 103-1 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය උපකරණ | 245,000.00 |
| 203-8 | වෙනත් ගබඩා භාණ්ඩ | 200,000.00 |
| 104-1-1 | යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 300,000.00 |
| 104-1 | වාහන අලුත්වැඩියාව හා නඩත්තුව | 50,000.00 |
| 204-1 | වාහන අලුත්වැඩියාව හා නඩත්තුව | 50,000.00 |
| 504-1 | වාහන අලුත්වැඩියාව හා නඩත්තුව | 1,000,000.00 |
| 604-1 | වාහන අලුත්වැඩියාව හා නඩත්තුව | 50,000.00 |
| | | 5,710,000.00 |
| | අතිරික්තය (5,900,000.00 - 5,710,000.00) | 190,000.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

34. දෙබරවැව ජාතික පාසලේ අභ්‍යන්තර පිවිසුම් මාර්ග පද්ධතිය සකස් කර ගැනීමට කැටගල් ලබා ගැනීම සඳහා ඉල්ලීම් ලිපියක් යොමු කර ඇති බැවින්, කාපට් අතුරන ලද මාර්ගවල ගලවා ඇති කැටගල් මෙකී කටයුත්ත සඳහා ලබා දීමටත්, තාක්ෂණ සේවා නිලධාරී අධීක්ෂණය යටතේ මෙම කටයුත්ත ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමටත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

35. 2023 වර්ෂය සඳහා පරිසර බලපත්‍ර ගාස්තු හා ස්ථානීය පරීක්ෂණ ගාස්තු සංශෝධනය වී ඇති බැවින්, මධ්‍යම පරිසර අධිකාරිය මගින් ලබා දුන් සංශෝධිත ගාස්තු 2023 ජනවාරි මස 01 වන දින සිට අය කර ගැනීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

36. දකුණු පළාතේ පිහිටි පළාත් පාලන ආයතනවල විධායක/මාණ්ඩලික නිලධාරීන්ට ප්‍රවාහන පහසුකම් ලබා දීමට අදාළව පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති දෙපාර්තමේන්තු චක්‍රලේඛ/ CLG/01/2020 හා 2020.10.24 දිනැති ලිපිය මගින් දන්වා ඇති පරිදි ප්‍රාදේශීය සභාවක බලතල හා කාර්යයන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සභාවේ ප්‍රධාන පරිපාලන නිලධාරියා වන්නා වූ ලේකම්වරයාට 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 19(1) (XXXII) වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 132 (ච) වගන්තිය ප්‍රකාරව , රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 (XXXIII) පරිදි සභාවේ පවතින වාහන සංඛ්‍යාව හා ප්‍රතිපාදන වෙන් කිරීමේ හැකියාව මත කාර්යාලය හා නිවාස ආසන්න ස්ථාන අතර ගමන් කිරීම සඳහා 2023 වර්ෂයට ප්‍රවාහන පහසුකම් සැපයීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ **<u>රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

- **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා</u>**

37. මාගම කොට්ඨාසයේ පහත සඳහන් ප්‍රධාන මංසන්ධිවල අධි දීප්ත විදුලි පහන් කට්ටල අලුතින් සවි කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

    - මාගම අක්කර 18 හන්දිය
    - මාගම ගල් කැටිය පළම අසල
    - අට්ටික්කාව චමල් රාජපක්ෂ අමුණ අසල
    - හල්මිල්ලාව වැලිගෙඩිය තොටුපල අසල
    - අන්දරගස්යාය හන්දිය
    - කිරින්ද රෝහල අසල
    - ගොඩාන ප්‍රාදේශීය සභා පෙර පාසල අසල
    - මාගම විහාරස්ථානය අසල
    - මාගම මහා විද්‍යාලය අසල
    - කෝන්වැලැන චමල් රාජපක්ෂ අමුණ අසල

    එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. සිසිර කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.
    එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ **<u>රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

- **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, චතුමිණි දිල්ෂාණි මෙනවිය</u>**

38. තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් එකමුතුගම හා අංජලිගල ග්‍රාම නිලධාරී වසම් 02 ට අයත් ප්‍රධාන මාර්ගයේ එකමුතුගම වසමේ අඩි 100 මාර්ගයේ කෙලවර කොටස හා අංජලිගල වසමේ මැදවච්ච කොටසෙහි කාපට් මාර්ගයේ කොටස් 02 ක් දැඩි සේ අබලන්ව ඇති බැවින්, වැසි සමයත් සමඟ ගමනාගමනය දැඩි සේ අසීරු වී ඇත. දෛනිකව මහජනතාව ප්‍රධාන ලෙස නගරයට යැමට, පාසල් වලට යැමට හා අත්‍යාවශ්‍ය සේවා සඳහා භාවිතා කරන එකී මාර්ග දෙකෙහි අබලන්ව ඇති මෙම කොටස් දෙක කඩිනමින් තාක්ෂණ සේවා නිලධාරී හරහා අධීක්ෂණය කර, සුදුසු පිළියමක් කඩිනමින් සකසා දෙන ලෙසට මෙම ගරු සභාවට යෝජනා කරමි.

    එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.

    ❖ **<u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

    <u>මේ සම්බන්ධයෙන් වාරිමාර්ග ඉංජිනේරු වෙත දන්වා යැවීමට තීරණය විය.</u>

    එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) කාරක සභාවල වාර්තා සළකා බැලීම -**

❖ 2022.12.13 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ 2022.12.13 වන දින පැවති නිවාස හා ප්‍රජා කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ 2022.12.13 වන දින පැවති කාර්මික සේවා කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ 2022.12.13 වන දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

## (ඌ) වෙනත් කරුණු

❖ **ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**

තිස්සමහාරාම වැව් කණ්ඩියේ වාහන නතර කිරීම සඳහා ටෙන්ඩර් පටිපාටිය අනුව තෝරා ගන්නා ලද බදුකරුවෙකු වෙත බදු අය කිරීම සඳහා අවසරය ලබා දී තිබුණද, එහි බදු අය කිරීමේ දී පොලිස් ස්ථානයෙන් සහ ජංගම වෙළඳුන්ගෙන්, බෝට්ටු හිමියන් විසින් ඇතැම් බාධාකාරී තත්ත්වයන් නිරන්තරයෙන් ඇති කරනු ලබයි. මේ සම්බන්ධයෙන් කිහිප අවස්ථාවක්ම පොලිස් ස්ථානය දැනුවත් කළද, මෙකී කටයුතු තවමත් නතර වී නොමැත. සභාවට ලැබිය යුතු ආදායමක් අහිමි කිරීමට කිසිවකුට නොහැක. එම නිසා සභාවට ලැබිය යුතු ආදායමක් අහිමි කිරීම සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් ඇති නොකරන ලෙසට නැවතත් පොලිස් ස්ථානය වෙත ලිපියක් මගින් දන්වා යැවීමටත්, එසේ නැතිවුවහොත් පොලිස්පතිතුමාට මේ සම්බන්ධව දන්වා යැවීමට සිදු වන බවත් එකී ලිපියේ සඳහන් කරන ලෙසට විෂය නිලධාරීට උපදෙස් ලබා දෙන ලදී.

තිස්සමහාරාම නගරයේ ස්ථාපිත කර ඇති එළවලු කඩ දෙකෙන් පාරිභෝගික ජනතාවට වාසි සහ අවාසි යන කරුණු දෙකම ලැබෙනු ඇත. කාර්ය බහුල ජීවිතයක් ගත කරන ජනතාවට නැවුම්, ඉතා අඩු මුදලට, අවශ්‍ය ප්‍රමාණයට ලබා ගත හැකි නිසාත් පහසුව නිසාත් මෙම එළවලු කඩවලින් එළවලු ලබා ගැනීම සිදු කරනු ලබයි. නමුත් තිස්සමහාරාම පොදු වෙළඳපොළ යනු සභාවේ වත්කමකි. ඒ සඳහා පාරිභෝගිකයින් නොපැමිණීමෙන් සභාවට ලැබිය යුතු ආදායමද අහිමි යනු ඇත. එම නිසා මේ සම්බන්ධයෙන් නිවැරදි සුදුසු තීරණයක් ගත යුතු බව ප්‍රකාශ කර සිටින ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා සභික, චමින්ද ඩයස් වන්නිගේ මහතා**

තිස්සමහාරාම නගරයේ ස්ථාපිත කර ඇති එළවළු කඩ 02 නිසා තිස්සමහාරාම පොදු වෙළඳපොළ වෙළඳුන්ට දැඩි ආසාධාරණයක් සිදු වී ඇත. පොදු වෙළඳපොළට යම් දුර ප්‍රමාණයකින් එළවළු කඩ ස්ථාපිත කිරීම පිළිබඳ සභාවේ නීතියක් පවතීද යන්න විමසන ලදී. තිස්සමහාරාම හි ඇති මෙම එළවළු කඩ 02 නිසා තිස්සමහාරාම පොදු වෙළඳපොළට පාරිභෝගිකයින් නොපැමිණීම නිසා ඔවුන්ගේ ආදායම් තත්ත්වය දැඩි සේ පහල බැසීමක් සිදුව ඇත. මේ සම්බන්ධයෙන් සුදුසු විකල්පයක් ලබා ගෙන, වෙළඳපොළෙහි වෙළඳුන් සඳහා සාධාරණයක් ඉටු කර දිය යුතු බව ප්‍රකාශ කර සිටින ලදී.

ලංකාවේ අනෙක් ප්‍රදේශ ගත් කළ පොදු වෙළඳපොළට ආසන්නයේ එළවලු කඩ නොපවතී. පොදු වෙළඳපොළක් යනු සභාවේ වත්කමකි. මෙකී කරුණ සම්බන්ධයෙන් යම් තීරණයක් ගරු

සභාපතිතුමාට ගත හැකි නම්, එය මහා සභාවට ඉදිරිපත් කර, සම්මත කර පොදු වෙළඳපොළ වෙළඳුන් සඳහා ද යම් වෙළඳපොළක් ලබා දෙන ලෙසට ඉල්ලා සිටින ලදී. තවද, මේ සම්බන්ධයෙන් යම් යම් දේශපාලන තත්ත්වයන් පිළිබඳ නොසලකා පොදු වෙළඳපොළ වෙළඳුන් සඳහා සාධාරණයක් ඉටු වන ලෙසට මෙම එළවලු කඩ 02 සඳහා වෙනත් සුදුසු ස්ථානයක් ලබා දීමට යම් වැඩපිළිවෙලක් සකස් කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා</u>**

ලංකාව පුරාම මෙලෙස එළවලු කඩ පවත්වාගෙන යනු ලබයි. එළවලු කඩ පවත්වාගෙන යාමේදී පාරිභෝගිකයින්ට වාසි/අවාසි දෙකම පවතී. කාර්ය බහුල ජීවිතයක් ගත කරන ජනතාවට නැවුම්, ඉතා අඩු මුදලට, අවශ්‍ය ප්‍රමාණයට ලබා ගත හැකි නිසාත් පහසුව නිසාත් මෙම එළවලු කඩවලින් එළවලු ලබා ගැනීම සිදු කරනු ලබයි. එම නිසා මේ සම්බන්ධයෙන් තීරණයක් ලබා ගැනීමේ දී එළවලු කඩ හිමියන්ගේ ආදායම් තත්ත්වය අහිමි වීමට ඉඩ නොදිය යුතු බව ප්‍රකාශ කරන ලදී.

යම් වෙළඳපොළක මිල ගණන් සඳහන් කිරීම කළ යුතු බවට පාරිභෝගික අධිකාරී පනතේ ඇත. යම් වෙළඳසැලක මිල සඳහන් කිරීමක් සිදු නොකර වෙළඳාම් සිදු කරන්නේ නම්, ඒ සම්බන්ධයෙන් පාරිභෝගික අධිකාරිය දැනුවත් කිරීම් කළ හැකිය. තවද, මෙම එළවලු කඩ 02 සම්බන්ධයෙන් දැන් තීරණයක් ලබා ගැනීමට පෙර ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර බලපත්‍රය ලබා ගැනීමේ දී මේ සඳහා තීරණයක් ගැනීමට තිබුණු බව සඳහන් කර සිටින ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතා</u>**

එළවලු මිනිසුන්ට ඉතා අත්‍යාවශ්‍ය දෙයකි. තිස්ස පොදු වෙළඳපොළ නගරය මධ්‍යයේ තිබුණත්, නගරයට ඈතින් තිබෙන එලවලු කඩ සඳහා පාරිභෝගිකයින් යනු ලබන්නේ අඩු මුදලකට එළවලු ලබා ගත හැකි වීම නිසාය. තිස්ස පොදු වෙළඳපොළෙහි කිසි දිනක මිල සඳහන් කිරීමක් සිදු නොකරනු ලබයි. වෙළඳාම් කිරීමේ අයිතිය ඕනෑම මිනිසකුට තිබෙනු ඇත. මෙම එළවලු කඩ 02 න් බොහෝ පිරිසක් සඳහා රැකියා අවස්ථාවන් ද බිහි වී ඇත. ගම්වල පවතින කුඩා කඩ සඳහා තොග මිලට එළවලු ද මෙම එළවලු කඩවලින් ලබා දෙනු ලබයි. එයද ගම්වල කඩහිමියන්ට ලැබෙන වාසියකි. ජනතාව පවතින කාර්යබහුලත්වයත් සමඟ එළවලු කඩවලින් එළවලු ලබා ගැනීමට පෙළඹෙනු ඇත. මෙකී කරුණු ගත් කළ එළවලු කඩ ඉවත් කිරීමෙන් පාරිභෝගිකයින්ට අසාධාරණයක් සිදු වෙතැයි අපේක්ෂා කරමි.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.ඩබ්. නන්දා මහත්මිය</u>**

එළවලු කඩ 02 හිද මිල ප්‍රදර්ශනය කිරීමක් සිදු කර නොමැති නිසා යම් අවස්ථාවල එළවලු මිලදී ගෙන මුදල් ගෙවීමට ගිය පසුව එළවලු මිල දැන ගැනීමට සිදුවීමෙන් අපහසුතාවයකට පත් වීමට සිදු වන බව ප්‍රකාශ කර සිටින ලදී. පොදු වෙළඳපොළට එළවලු ගැනීමට ගිය පසුව මිල ගණන් විමසා එළවලු ගැනීම සිදු කළ හැකි වීම පාරිභෝගිකයින්ට ලැබෙන වාසියක් ලෙස පෙන්වා දිය හැකිය.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණී මහතා</u>**

මෙකී කරුණ ගත් කළ අපට මුලින්ම පෙනී යන්නේ සභාවට ලැබෙන ආදායම් අඩු වීම පිළිබඳවයි. එළවලු කඩවලින් නැවුම් එළවලු, අවශ්‍ය ප්‍රමාණයට ගත හැකිය. පාරිභෝගිකයින්ට වාසි/අවාසි 02 ම එළවලු කඩවලින් සහ පොදු වෙළඳපොළෙන් තිබෙනු ඇත. කරුණු කෙසේ වුනත් සභාවක් ලෙස අප මුලින්ම බැලිය යුත්තේ ජනතාවගේ සුබ විහරණයයි. දෙවනුව සභාවට ලැබිය යුතු ආදායම පිළිබඳ බැලිය යුතුය. එම නිසා මෙම කරුණ සම්බන්ධයෙන් කමිටුවක් පත් කර විශ්ලේෂණය කර, අධීක්ෂණයක් යටතේ මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. බොහෝ පාරිභෝගිකයින් පහසුව, ගුණාත්මකබව, අවම මිල පිළිබද වැඩිපුර සොයා බලන නිසා ඒ සම්බන්ධයෙන් සිතා බලා යම් තීරණයකට එළඹීම සුදුසු වන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතා**

අද දින එළවලු කඩ සම්බන්ධයෙන් සාකච්ඡා වූ කරුණ යෝජනාවක් ලෙස ඉදිරිපත් කර සම්මත කර ගත යුතු දෙයකි. අද දින මෙම එළවලු කඩ සම්බන්ධයෙන් අදහස් දැක්වීම් කළද, මෙම කරුණ දැනට බොහෝ දුර ගොස් ඇත. එම නිසා මෙම කරුණ සම්බන්ධයෙන් පුළුල්ව සාකච්ඡාවක් ලබා ගෙන යම් කාලයක් ලබා ගෙන තීරණයක් ගත යුතු දෙයකි. එසේම තිස්ස පොදු වෙළඳපොළ පවතින අඩුපාඩුකම් නිසාත්, එහි එලවලු ඉතා අධික මුදලකට අලෙවි කිරීම යන චිත්‍රය පාරිභෝගිකයින්ට මවාපෑමක් සිදු කර ඇති නිසා, එම චිත්‍රය තුළම සිට ජනතාවට කටයුතු කරයි. එම නිසා ප්‍රථමයෙන් එලෙස මවා පා ඇති චිත්‍රය නැති කර දමන ලෙසට පොදු වෙළඳපොළ වෙළඳුන්ගේ සංගමය හෝ දැනුවත් කිරීම සුදුසු වන බව සඳහන් කරන ලදී.

❖ **ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**

තිස්සමහාරාම නගරයේ ස්ථාපිත කර ඇති එළවලු කඩ දෙකෙන් පාරිභෝගික ජනතාවට වාසි සහ අවාසි යන කරුණු දෙකම ලැබෙනු ඇත. කාර්ය බහුල ජීවිතයක් ගත කරන ජනතාවට නැවුම්, ඉතා අඩු මුදලට, අවශ්‍ය ප්‍රමාණයට ලබා ගත හැකි නිසාත් පහසුව නිසාත් මෙම එළවලු කඩවලින් එළවලු ලබා ගැනීම සිදු කරනු ලබයි. නමුත් තිස්සමහාරාම පොදු වෙළඳපොළ යනු සභාවේ වත්කමකි. ඒ සඳහා පාරිභෝගිකයින් නොපැමිණීමෙන් සභාවට ලැබිය යුතු ආදායමද අහිමි වී යනු ඇත. එසේම බොහෝ පාරිභෝගික ජනතාව තිස්ස පොදු වෙළඳපොළෙහි එළවලුවල මිල ඉතා අධික යැයි කියමින් ඒ සඳහා නොපැමිණෙන බවට කරුණු දැන ගැනීමට ලැබී ඇත.

ජනතාව වෙනුවෙන් නීති සම්පාදනය කිරීමට අතුරු ව්‍යවස්ථාව මගින් අපට සිදු කළ හැකිය. එම නිසා මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර තීරණයක් ලබා ගත හැකි බව ප්‍රකාශ කර සිටින ලදී.

තිස්සමහාරාම වෙළඳපොළ වෙළඳුන් සඳහා පාරිභෝගිකයින් නොපැමිණීම නිසා යම් අසාධාරණයක් සිදු වේ නම්, ඒ සඳහා විකල්පයක් ලෙස තිස්සමහාරාම වෙළඳපොළ වෙළඳුන්ගෙන් පාරිභෝගික ජනතාවට අසාධාරණයක් නොවන පරිදි වෙළඳාම් කරන බවට ලිපියක් ලබා ගෙන, ඒ පිළිබඳ ප්‍රජා සංවර්ධන නිලධාරී, ආදායම් පරීක්ෂක ගොස් පරීක්ෂා කර බලා දෛනික වාර්තාවක් ලබා ගැනීම සුදුසු වන බව ප්‍රකාශ කර සිටින ලදී.

තිස්සමහාරාම නගරයේ ස්ථාපිත කර ඇති එළවලු කඩ 02 සම්බන්ධයෙන් අද දින දක්වන ලද අදහස් තර්කානුකූලව ලබා ගෙන, යම් නිවැරදි තීරණයකට එළඹීමට කටයුතු කළ හැකිය. එළවලු කඩ 02 න් සහ පොදු වෙළඳපොළෙන් පාරිභෝගික ජනතාවට ලැබෙන වාසි/අවාසි 02 කම තිබේ. එම නිසා මේ සම්බන්ධයෙන් කණ්ඩායමක් වශයෙන් ගොස් පරීක්ෂා කිරීම සුදුසු වන බව ප්‍රකාශ කරන ලදී.

අද දින සාකච්ඡා වූ මෙම කරුණ සම්බන්ධයෙන් මුදල් කමිටුවේදී සාකච්ඡා කර කමිටුවක් පත් කර ගැනීම සුදුසු වන බවත්, ප්‍රදේශයට බලපා ඇති සුවිශේෂී ගැටළුවක් ලෙස මේ මෙම ගැටළුව පැනනැගී ඇති බැවින්, කමිටුව පත් කළ පසුව, මේ සම්බන්ධයෙන් ආදායම් පරීක්ෂක නිලධාරී වාර්තාව සහ පත් කරන ලද කමිටු නිලධාරීන්ගෙන් මෙහි පවතින නෛතිකභාවය සහ ක්‍රියාකාරීත්වය පිළිබඳ වාර්තාවක් ලබා ගෙන, මේ සම්බන්ධව එළවලු කඩ හිමියන් සහ පොදු වෙළඳපොළ වෙළඳුන් ගෙන්වා, නිවැරදි තීරණයක් ලබා ගැනීමට තීරණය විය.

❖ **ගරු ප්‍රාදේශීය සභා සභික, ජී.එච්.ජී. නීටා මහත්මියගේ අදහස් දැක්වීම**

තමා පෙර පාසල් ගුරුවරියක් සේ කටයුතු කර, පළාත් පාලන මැතිවරණයෙන් ප්‍රාදේශීය සභාවේ නියෝජිතයෙක් සේ පත් වූයේ, පෙර පාසල් සම්බන්ධයෙන් තිබෙන ගැටළු හඳුනා ගෙන,පෙර පාසල් ගුරුවරුන්ගේ අවශ්‍යතාවයන් සොයා බලා ඉටු කර දීමටය. තිස්සමහාරාම බල ප්‍රදේශයේ ලියාපදිංචි පෙර පාසල් 59 ක් පවතින අතර, එම පෙර පාසල් සඳහා සිදු කරන ලද සේවය අගය කළ යුතුය. එසේම 2022 වර්ෂයේ සභාව සතු පෙර පාසල් සඳහා පෝෂණීය ආහාරවේලක් ලබා දීම ඉතාමත් උතුම් කාර්යයකි. එසේම ඉදිරියේ දී තිස්සමහාරාම බල ප්‍රදේශයේ අනෙකුත් පෙර පාසල් දරුවන් සඳහා ද පෝෂණීය ආහාර ලබා දීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

මා සභිකයෙක් ලෙස පැමිණීමට පෙර මා සේවය කරන ලද ශ්‍රී සුචරිත හේමාලෝක පෙර පාසලද වර්ෂය කිහිපයකට පෙර සභාවට පවරා ගැනීමට කටයුතු කරන බවට ගරු සභාපතිතුමා විසින් කරන ලද ප්‍රකාශය අද දින ඉටු වීමේ කටයුතු සිදු වීම මා හට සතුටට කරුණකි. පෙර පාසල් දරුවන් වෙනුවෙන් ගරු සභාපතිතුමා විසින් සිදු කරන්නාවූ මහඟු සේවයට මාගේ ගෞරවණීය ස්තුතිය පුද කරන ලදී.

සභාව නියෝජනය කරන කාන්තා සභිකයින් වන අප හට සභාවේ ලේකම්තුමිය අම්මා කියන චරිතයේ හිද අප සියලුම දෙනා ඉල්ලීම් කරන සෑම දෙයක්ම ඉටු කර දී ඇති නිහතමානී ලේකම් කෙනෙක් ලෙසත්, අපගේ ගෞරවය එතුමියට ලබා දෙන බවත් ප්‍රකාශ කරන ලදී.

පන්නෙගමුව කොට්ඨාසයේ සංවර්ධනය කටයුතු සිදු කිරීමේ දී කොට්ඨාසයේ පවතින අඩුපාඩුකම් පිළිබද තමා ද පෙන්වා දෙමින් ලබා දිය යුතු සහායන් ලබා දෙන ලදී. පන්නෙගමුව ගොවි සෙවණ ක්‍රීඩාංගනය මීට පෙර ගව ගාලක් සේ තිබූ ස්ථානයකි. එකී භූමියට වටිනාකමක් ලබා දෙමින් අද වන විට හොද ක්‍රීඩාපිටියක් ලෙස සංවර්ධනය කර ඇත. මාර්ග සංවර්ධනය කිරීම්, විථි පහන් අලෝක කිරීම් කටයුතු ආදි සේවාවන් අප ඉටු කිරීම වෙනුවෙන් ගරු සභාපතිතුමාට ස්තුතිය පුද කරන ලදී.

අප විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේගේ මෑනියන් මිය ගිය අවස්ථාවේ වැඩම කරනවන ලද ස්වාමීන් වහන්සේ 40 නමක් සඳහා ගරු සභාපතිතුමා විසින් පිරිකර ලබා දීමට කටයුතු කිරීම වෙනුවෙන් එතුමන්ට ස්තුතිය පුද කරන ලදී.

මා සෑම විටකම ජනතාව වෙනුවෙන් දිය හැකි සේවාවන් ලබා දීමට මැදිහත් වී කටයුතු කරන ලදී. පෙර පාසල් දිවියේ ද හොද දෙයක් කරමින්, දරුවන්ට ගුණ නුවණ ලබා දීමට කටයුතු කර ඇත. මෙකී සෑම සේවාවක්ම ජනතාව වෙනුවෙන් සිදු කරන ලද සේවාවන් නිසා, එකී පිං මහිමය මත ලැබෙනු ඇත. ඒ පිළිබදව මා හට සතුටු වන බව ප්‍රකාශ කරන ලදී.

සභිකයෙක් ලෙස මගෙන් ඉටු විය යුතු සේවාවන් මා නොමදව ඉටු කර ඇත. මාසික මහා සභාව සේම, කමිටු සඳහා ද පෙනී සිට ජනතාව වෙනුවෙන් මාගේ සේවාව ඉටු කර ඇති බව කිව යුතුය.

ගරු සභාපතිතුමාට ඉදිරියටත් මැතිවරණයෙන් තේරී පත්ව ජනතාවාදී සේවයක් කිරීමට ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදී.

ලබන්නා වු 2023 නව වසර රටවාසි ලෝකවාසී සියලුම දෙනාට සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, චාලි ගුණරත්න මහතාගේ අදහස් දැක්වීම</u>**

සියඔලාගස්වැව මීට වසර 10 කට පෙර සකස් කරන ලද වැවකි. මේ වන විට එම වැවට ඉහලින් තවත් වැවක් සකස් කර ඇත. වැව් කාවේ වැවක් බැදීම දැඩි හානියකි. මේ නිසා ගොවි ජනතාවගේ ගොවි බිම් සඳහා ජලය ගෙන යන ජල පෝෂක ප්‍රදේශ ඇහිරී ඇති බැවින්, මේ සම්බන්ධයෙන් ගොවි ජනතාව නිරන්තරයෙන් තමාට දන්වන ලදී. එම නිසා මේ සම්බන්ධයෙන් ගොවි ජන කොමසාරිස්, ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා යැවිය යුතු බව ප්‍රකාශ කරන ලදී.

මා දීර්ඝ කාලයක සිට ප්‍රාදේශීය සභාව නියෝජන කරමින් සභිකයෙකු පෙනී සිට කටයුතු කර තිබුණද, මා යෝජනා කළ එක් යෝජනාවක් හෝ මා හට ඉටු කර ගැනීමට නොහැකි වී ඇත. යෝධ වැවත් සමඟ තිබෙන වළ ඇල දොර ආසන්නයේ දිය සිදුරක් තිබෙන බැවින්, දිය කාන්දු වීමක් සිදු වන නිසා, මේ සඳහා සුදුසු පියවරයන් ගත යුතුය. තවද, මෙහි කාන්දු වීම වැඩි වශයෙන් සිදු වුවහොත්, එම ප්‍රදේශයෙට ලොකු හානියක් සිදු විය හැකි බැවින්, වැව් රක්ෂිත ඇල රක්ෂිත වෙන් කර දී මෙහි පවතින

අවධානම් තත්ත්වය අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගන්නා ලෙසට වාරිමාර්ග ඉංජිනේරුතුමා වෙත දන්වා යවන ලෙසට ඉල්ලා සිටින ලදී.

තවද, වල ඇල දොරෙහි වන්දනාකරුවන් දියනෑම සඳහා වන්දනා නතර කිරීම නිසා එම මාර්ගයේ ගමන් කරන්නන් හට අනතුරුදායක තත්ත්වයක් පවතින බැවින්, මෙහි අනතුරුදායක තත්ත්වය අවම කිරීම සඳහා වාහන නතර කිරීම සඳහා ස්ථානයක් සකස් කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී. මෙකී යෝජනාව ගරු සභාපතිවරුන් සිටි පාලන කාලයන් කිහිපයක කතා කළද, කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට නොහැකි වූ බැවින්, ගරු සභාපතිතුමාගේ කාලය තුළ හෝ මෙම අනතුරුදායක තත්ත්වය වළක්වා ගැනීම සඳහා පියවරක් ගන්නා ලෙසට ඉල්ලා සිටින ලදී.

2022 නව වසර සියලුම දෙනාට නිදුක් නීරෝගී සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ **<u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>වල ඇල දොර අසල වාහන නතර කිරීම සඳහා අවධානම් තත්ත්වයක් තිබුණද, වාහන නතර කිරීම සඳහා ස්ථානයක් සකස් කිරීමට නම්, ඒ අසල තිබෙන කුඹුරු ඉඩම ලබා ගත යුතුය. නමුත් කුඹුරු ඉඩම් හිමියා කිසි දිනක එම කුඹුරු ඉඩම ව්‍යාපෘතියක් සඳහා ලබා නොදන බැවින්, මෙම ව්‍යාපෘතිය සිදු කළ නොහැකි බව ප්‍රකාශ කරන ලදී.</u>

<u>මේ සඳහා සාර්ථක ව්‍යාතියක් තිබෙන් නම් අදාළ ආයතනයන් වෙත එම ව්‍යාපෘතිය ඉදිරිපත් කර ඉදිරි කටයුතු සිදු කර ගත හැකිය. රක්ෂිත බොහෝ පිරිස අල්ලා ගෙන තිබේ. මේ සම්බන්ධයෙන් හිටපු ආණ්ඩුකාරතුමා තිස්සමහාරාමට පැමිණි අවස්ථාවේ මෙම කරුණ පිළිබඳ දන්වා, අදාළ ස්ථානය පෙන්වීම සිදු කළ පසුව, ව්‍යාපෘතියක් සිදු කිරීම සඳහා මුදල් ප්‍රතිපාදන ලබා දිය හැකි බවට දැන්වූවද, ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා අවශ්‍ය බිම් ප්‍රමාණයක් එහි නොමැති නිසා, එම කාලය තුළ ව්‍යාපෘතිය සිදු කිරීමට නොහැකි වූ බව ප්‍රකාශ කරන ලදී.</u>

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.ඩබ්. නන්දා මහත්මියගේ අදහස් දැක්වීම</u>**

2022 වර්ෂයේ අවසන් මහා සභාව අද දිනයි. අප විසින් සම්මත කර දෙන්නා වූ යෝජනා 2023 වර්ෂයේ සාර්ථකව ඉටු කර ගැනීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී. ගරු සභිකයින් සියලුම දෙනා සභිකයින්ගේ ගෞරවය රැකෙන පරිදි කටයුතු කිරීම සම්බන්ධයෙන් සභිකයින් සියලුම දෙනාට ස්තුතිය පුද කරන ලදී. එසේම ගරු සභාපතිතුමා හොඳ නායකයෙක් ලෙස සිදු කරන්නා වූ සේවය ඉදිරියටත් එතුමන්ට සාර්ථකව සිදු කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. සිසිර කුමාර මහතාගේ අදහස් දැක්වීම</u>**

2023 වර්ෂයේ අයවැය සම්මත කරන දින මල ගෙදරක් නිසා පැමිණීමට නොහැකි වීම කණගාටුවට කරුණකි. එදින පැමිණීමට නොහැකි වුවත්, ගරු සභාපතිතුමා සිදු කරන්නාවූ නිවැරදි දේ සඳහා මාගේ සහාය සෑම දිනකම ලබා දෙන අතර, 2023 වසරේ සිදු කරන්නා වූ සෑම කාර්යක්ම ගරු සභිකයින් සියලුම දෙනාගේ සහාය ලබා ගනිමින් සාර්ථකව සිදු කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

ලබන්නා වූ 2023 නව වසර සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, වැල්ලගේ ජීවානි මහත්මිය අදහස් දැක්වීම</u>**

යෝධකණ්ඩිය වැව පිටාර ගැලූ පසුව, යෝධකණ්ඩිය දැහැමි මාවත මාර්ගයේ පෞද්ගලික ඉඩමක වතුර පිරීම නිසා, මාර්ගයේ ගමන් කිරීමටත්, ඒ අවට ඉඩම්වලටත් දැඩි අපහසුතාවන්ට පත්

වීමට සිදු වන බැවින්, ඉඩම තුළ පිරෙන වතුර බැස්සවීම සඳහා සිලින්ඩරයක් ලබා දෙන ලෙසට මීට පෙර මහා සභාවකදී මා විසින් ඉල්ලීමක් කරන ලදී. පෞද්ගලික ඉඩමක් නිසා එම ඉඩමේ ගැටලුකාරී තත්ත්වයක් තිබෙන නිසා, එම ඉඩමට අදාළ ලිපි ලේඛන ප්‍රාදේශීය සභාවට ගෙනවිත් දුන්නද, එය ලැබී නොමැති බව සභාවෙන් දන්වන ලදී. මේ සම්බන්ධයෙන් සොයා බලන ලෙසට ඉල්ලා සිටින ලදී.

සභිකයෙක් ලෙස පත් වූ කාලය තුල සියලුම ගරු සභිකයින් එක්ව එකට එකතු වී වැඩ කිරීමට හැකි වූ බවත්, සභිකයින් සියලුම දෙනා එම කාලය තුළ ලබා දුන් සහායටත් ස්තූතිය පුද කරන ලදී.

ලබන්නා වූ 2023 නව වසර සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ <u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>යෝධකණ්ඩිය දැහැමි මාවත මාර්ගයේ වතුර පිරෙන පෞද්ගලික ඉඩම සම්බන්ධයෙන් තාක්ෂණ සේවා නිලධාරීගෙන් වාර්තාවක් ලබා ගැනීම තීරණය විය.</u>

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, චමින්ද ඩයස් වන්නිගේ මහතාගේ අදහස් දැක්වීම</u>

අප පාලන කාලය තුළ සිටි සභිකයින්ගෙන් අද වන විට 04 දෙනෙක් මෙම මහා සභාව තුළ අද දින නොමැත. නමුත් අප සියලුම දෙනා එකට එක්ව මෙම සභාවේ කටයුතු සිදු කරන ලදී. ගරු සභාපතිතුමාගේ හොද නායකත්වය මැද සාර්ථකව වැඩ කිරීමට අපටත් හැකි විය. ඉදිරියේ මැතිවරණයක් පැවැත්වුවත් ජනතාවගේ මනාපයෙන් නැවතත් නියෝජිතයින් පත් වේ. අද දින සිටින ගරු සභිකයින් සියලුම දෙනාම නැවතත් පත් වී තිස්සමහාරාමට සාර්ථක වැඩ කොටසක් සිදු කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී. එසේම ගරු සභාපතිතුමාගේ හොද නායකත්වය මැද තිස්සමහාරාමයට ඉදිරියටත් හොද වැඩ කොටසක් සිදු කිරීමට නැවතත් ගරු සභාපතිතුමාට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී. එසේම ගරු සභාපතිතුමාගේ දේශපාලන දිවියට ආශිර්වාද කරන බවත් දන්වා සිටින ලදී.

2023 නව වසර ප්‍රදේශවාසී, රටවාසි සියලුම ජනතාවට සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතාගේ අදහස් දැක්වීම</u>

අප වසර 05 කට ආසන්න කාලයක් සභික ධූරයේ හිද කටයුතු කළද, තවමත් අප කොට්ඨාසයේ ගමන් කිරීමට නොහැකි තත්ත්වයේ පවතින මාර්ගයක් පවතින බැවින්, එකී මාර්ගය අප පාලන කාලය අවසන් වීමට පෙර මෝටර් ග්‍රේඩර් කර හෝ දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

නැදිගම්විල මාගමට දිවෙන බස් රථය ගමන් කරන මාර්ගය දෙපස ගමන් කිරීමට නොහැකි ලෙසට ගස් වැවී ඇති බැවින්, මාර්ගය දෙපස සුද්ධ කර ගැනීම සඳහා ජේ.සී.බී. එක ලබා දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

සභාවට තේරී පත් වී අප ජනතාව වෙනුවෙන් සිදු කරන්නාවූ සේවාවන් මත, අප හට ඊළඟ මැතිවරණයෙන් තේරීපත්ව නැවත සභාවට පැමිණීමට හැකි වන බව ප්‍රකාශ කර සිටින ලදී.

අප පාලන කාලය තුළ අපට නිවැරදි නායකයෙක් සහ හොද සභික මඩුල්ලක් ලැබුණු නිසා, සිදු කරන්නාවූ සෑම කාර්යයක්ම සාර්ථකව සිදු කර ගැනීමට හැකි විය. අප විසින් සිදු කරන්නාවූ සෑම කාර්යයක් සඳහාම ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා ඇතුළු සභික මණ්ඩලයේ සහාය නිරන්තරයෙන් ලබා දුන් අතර, එම සියලුම දෙනාට ස්තූතිය පුද කරන ලදී. ඉදිරියේ දී ශ්‍රී ලංකා

පොදුජන පෙරමුණ පක්ෂය ජයග්‍රහණය කර නැවත අප සභිකයින් සියලුම දෙනාට නියෝජනය කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

අප ප්‍රාදේශීය සභාව නියෝජනය කරමින් කටයුතු කළද, රට තුළ පසුගිය වර්ෂයන්වල ඇති වූ අර්බුධකාරී තත්ත්වයන් නිසා, ප්‍රාදේශීය සභාව මගින් ජනතාවට ලබා දිය යුතු සේවාවන් සිතූ පරිදි ලබා දීමට නොහැකි විය.

රට තුළ කොරෝනා වසංගත තත්ත්වය ව්‍යාප්ත වූ කාලය තුළ, රටේ මිනිසුන් යම් ප්‍රමාණයක් මියයෑමට ද ලක් විය. රටේ ජනතාව කොරෝනා වංසගතයෙන් බේරා ගැනීම සඳහා කෙරෝනා එන්නත්කරණ වැඩසටහන් සිදු කිරීමට අප හිටපු අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා කටයුතු කිරීමෙන්, අප රටේ ජනතාව එයින් බේරා ගැනීමට හැකි විය. ඒ වෙනුවෙන් අප එතුමන්ට විශේෂ ස්තුතියක් පුද කළ යුතුය. එතුමන් සිදු කළ එම උතුම් සේවාව කිසි දිනක අමතක කළ නොහැක. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂය නිවැරදි ගමනක් රැගෙන ගිය, කිසිදු වංචාවක් සිදු කර නොමැති නිහතමානී ජනාධිපතිවරයෙක් ලෙස පෙන්වා දිය හැකිය.

අප දිස්ත්‍රික්කය තුළ ගරු චමල් රාජපක්ෂ මැතිතුමා, ගරු නාමල් රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය මැද අප ප්‍රදේශය තුළ හොද වැඩ කොටසක් කිරිම සඳහා අපට හොද නායකයෙක් ලබා දෙන ලදී. ගරු සභාපතිතුමාගේ හොද නායකත්වය මැද අප සියලුම දෙනා නිවැරදි වැඩපිළිවෙලක් ගෙන යන ලදී. එසේම ගරු සභාපතිතුමා අපව නිරන්තරයෙන් ශක්තිමත් කළ, හොද නායකයෙක් ලෙස කිව යුතුය.

නැවත මැතිවරණයක් පැමිණෙන තෙක් අපගෙන් ඉටුවිය යුතු සේවාවන් වඩාත් සාර්ථක ලෙස ජනතාවට ලබා දීමට කටයුතු කරන බව දන්වා සිටින ලදී. එසේම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂය ජයග්‍රහණය කිරීම සඳහා සෑම විටකම කටයුතු කරන බවත් සඳහන් කරන ලදී.

ගරු සභාපතිතුමාගේ හොද නායකත්වය මැද, තම කොට්ඨාසය තුළ පස් මාර්ග සාදා ගැනීමට හැකි වී ඇති බවත්, කොට්ඨාසය තුළ සිදු කළ යුතු අනෙක් කාර්යයන්ද ගරු සභාපතිතුමාගේ සහාය මැද සිදු කර ගැනීමට හැකි වීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාට ස්තුතිය පුද කරන ලදී. එලෙස හොද වැඩ කොටසක් ඉදිරියටත් සිදු කිරීමට ගරු සභාපතිතුමාට ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදී. එසේම අප හට නිවැරදි ගමනක් යාමට නිරන්තරයෙන් මඟපෙන්වීම් සිදු කල, ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමාට නැවත වරක් ස්තුතිය පුද කරන ලදී.

එසේම ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් අප නිරන්තරයෙන් පවසන සෑම කාර්යයක්ම ඉටු කර දීම වෙනුවෙන් එම සියලුම දෙනාටත් ස්තුතිය පුද කරන ලදී.

ලබන්නාවූ 2023 නව වසර සියලුම දෙනාට සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතාගේ අදහස් දැක්වීම</u>**

අප පාලන කාලය තුළ වසර 05 ක් අවසන් වීමට පැමිණ ඇත. එම කාලය තුළ අප සියලුම දෙනා එක පවුලක් සේ එකට එකතු වී කටයුතු කර ඇත. 2017 වර්ෂයේ දේශපාලනයට ඇතුලත් වීමට පෙර රණවිරුවකු සේ මා කටයුතු කර, ඉන් අනතුරුව ජනතාව වෙනුවෙන් සේවයක් කිරීම සඳහා මැතිවරණයෙන් තේරී පත්ව අද මෙලෙසට කටයුතු කරන ලදී. එලෙස පත් වූ එදා සිට අද දක්වාම ගරු සභාපතිතුමාගේ හොද නායකත්වය මැද හොද ගමනක් ඒමට හැකි වී ඇත. සභිකයෙකු ලෙස තේරී පත් වූ පසුව, පළාත් පාලන පිළිබද පවත්වන ලද පුහුණු වැඩමුළු සඳහා සහභාගී වී ලොකු දැනුමක් ලබා ගැනීමට හැකි විය. එම ලබා ගන්නා දැනුමද සමඟින් ජනතා සේවය සිදු කරන ලදී. ඉදිරියටත් මැතිවරණයෙන් තේරී පත් වුවහොත්, අපගේ දැනුම තව තවත් වැඩි කර ගනිමින් ජනතාවාදි සේවයක් ඉටු කිරීමට බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරන ලදී.

අප සභාව තුළ සියලුම ගරු සභිකයින් මේ දක්වා පාට පක්ෂ භේද නොබලා එක පවුලක් සේ කටයුතු කිරීම සම්බන්ධයෙන් සතුටු විය හැකි බව ප්‍රකාශ කරන ලදී.

තම කොට්ඨාසය තුළ මාර්ග 02 ක් සකස් කර ගැනීමට තිබෙන බැවින්, එම මාර්ග 02 මෝටර් ග්‍රේඩර් කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

වර්ෂාවත් සමඟ ඩෙංගු රෝගය බෝ වීම වැඩි විය හැකි බැවින්, මේ සඳහා ශ්‍රමදාන වැඩසටහන් සිදු කිරීම සුදුසු වන බවත්, මේ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කර, ඩෙංගු වැඩසටහන් සිදු කිරීම සඳහා මාසයක් ප්‍රකාශයට පත් කර, නිවෙස්වල තිබෙන අබලි ද්‍රව්‍ය එකතු කර ගැනීමට හැකි වන පරිදි වැඩසටහනක් සකස් කිරීමට කටයුතු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

යෝධ කණ්ඩිය නගරය ආලෝක කිරීම සඳහා ද අධි දීප් විජී පහන් 06 ක් ලබා දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

යෝධකණ්ඩිය වල ඇල දොර අසල වන්දනා වාහන නතර කිරීම සඳහා ස්ථානයක් සකස් කිරීමේ ව්‍යාපෘතිය හොඳ දෙයක් බැවින්, ඒ සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීම සුදුසු බව දන්වා සිටින ලදී.

වසර 05 ක කාලයක සිට අප සියලුම දෙනා එකට හිඳ එක පවුලක් සේ අත්දැකීම් රැසක් ලබා ගනිමින් කටයුතු කිරීමට හැකි වීම සම්බන්ධයෙන් සහ සියලුම දෙනා ලබා දුන් සහාය වෙනුවෙන් ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා ඇතුළු සභික මණ්ඩලයට මාගේ ස්තුතිය පුද කරන ලදී.

ලබන්නා වූ 2023 නව වසර නිදුක් නීරෝගී සුබ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතාගේ අදහස් දැක්වීම</u>

සභිකයින් ලෙස ප්‍රදේශයේ රටේ ජනතාවට යම් හානියක් වෙන්නේ නම්, ඒ සඳහා සොයා බලා ක්‍රියාමාර්ග ගැනීම අප විසින් සිදු කළ යුතුය. පසුගිය දිනක මෙම ප්‍රදේශයේම බස් රථයක ඇතුළත ඉඩකඩ තිබියදී ළමුන් පාපුවරුවේ ගමන් කිරීම නිසා බස් රථයේ රියදුරු සහ කොන්දොස්තර ඇතුලු සියලුම දෙනා හට අපහුසතාවයන්ට පත් වීමට සිදු වේ. ළමුන් රියදුරු සහ කොන්දොස්තර මහතුන් කියන ප්‍රකාශ කිසිදු ඇසීමක් සිදු නොකරයි. එම නිසා මේ සම්බන්ධයෙන් අදාළ ආයතනයන් වෙත දන්වා සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීම සුදුසු වන බව ප්‍රකාශ කරන ලදි.

යෝධකණ්ඩිය විදුහලේ විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා පන්ති කාමරයක් තිබෙන අතර, එහි දරුවන් 10 දෙනෙක් පමණ සිටී. එම දරුවන් සඳහා ඉගැන්වීමට ගුරුවරයෙකු නොමැති වීම හේතුවෙන් ස්වේච්ඡාවෙන් සුදුසුකම්ලත් කාන්තාවක් ඉගැන්වීම් කටයුතු සිදු කරනු ලබයි. මෙම ගුරුවරිය සඳහා යම් මුදලක් එකතු කරමින් මාසිකව දීමනාවක් ලබා දීම සිදු කරන අතර, මේ සඳහා ප්‍රදේශයේ ව්‍යාපාරිකයින් සහ තමා ද මුල්‍යමය දායකත්වය ලබා දෙන ලදී. ස්වේච්ඡාවෙන් ඉගැන්වීම් කටයුතු කරන ගුරුවරිය අවශ්‍ය සුදුසුකම් සියල්ල සපුරා ඇති බැවින්, ගරු චමල් රාජපක්ෂ මැතිතුමාට සහ ගරු නාමල් රාජපක්ෂ මැතිතුමාට මේ සම්බන්ධයෙන් දන්වා යවා, මෙම ගුරුවරිය විධිමත් බඳවා ගැනීමේ පටිපාටිය අනුව, එකී පන්තිය සඳහා බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසට ඉල්ලා යැවීම සුදුසු බව දන්වා සිටින ලදී.

ජල පහසුකම් ලබා ගැනීමේ ගැටළුව අප ප්‍රදේශවල බෙහෙවින් තිබෙන ගැටළුවකි. ජල හිඟකම් තිබෙන පවුල් සඳහා ජල පහසුකම් ලබා ගැනීමට ණල ළිඳක් ඉදි කර ගැනීම සඳහාත්, විදුලිය නිපදවා ගැනීම සඳහා සූර්ය පැනල සවි කර ගැනීමටත් මුල්‍ය ආයතනයකින් ණය මුදලක් ලබා ගැනීම සඳහා එම පවුල් වෙත අවස්ථාවක් ලබා දීමට අප දේශපාලන නායකයින් සමඟ සාකච්ඡා කර අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

අද වන විට ජීවන වියදම දැඩි සේ ඉහල ගොස් ඇත. බඩු මිල ඉහල යාමත් සමඟ ජනතාව දැඩි අසරණභාවයකට පත් වී ඇති බැවින්, මේ සම්බන්ධයෙන් අදාළ ආයතනයන් සමඟ සාකච්ඡා කර බඩු මිල සඳහා යම් සහනයක් ලබා දීම සුදුසු වන බව ප්‍රකාශ කරන ලදී.

ප්‍රදේශය තුළ වන අලි උවදුර තවත් නොවිසඳී ඇති ගැටළුවකි.නිමලව අභය භූමිය සඳහා වන අලි පලවා හැර විදුලි වැට ගැසීමට කටයුතු කරන ලෙසට දැන්වූවද, අභය භූමියෙහි පවතින කුඩා කොටසක් කියා ඒ සඳහා අකමැත්ත ප්‍රකාශ කරන ලදී. මෙම වන අලි උවදුර සඳහා විසඳුමක් ලබා ගැනීමට ගරු වනජීවි අමාත්‍යතුමා වෙත සහ ගරු චමල් රාජපක්ෂ මැතිතුමාටත්, ගරු නාමල් රාජපක්ෂ මැතිතුමාටත් දන්වා යවා විසඳුමක් ලබා ගැනීම සුදුසු වනු ඇත.

පුස්තකාල පොත් මිලදී ගැනීමේ දී දරුවන් සඳහා අවශ්‍ය කරන පොත් මිලදී ගැනීමට ප්‍රමුඛතාවය ලබා දිය යුතුය. පොත් කියවීමට ළමුන් හුරු වූ පසුව ළමුන් නොමග යෑමේ අවස්ථාවන් ද අඩු කර ගැනීමට හැකි වනු ඇත. තිස්සමහාරාම ප්‍රදේශයේ බොහෝ දරුවන් මත් උවදුර සඳහා බෙහෙවින් පෙලඹී ඇත. මේ සම්බන්ධයෙන් ළමුන් දැනුවත් කර අත් පත්‍රිකාවක් හෝ බෙදා ගැනීමට හැකි නම් එය ප්‍රයෝජනවත් වන බව ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමා අපට ලැබුණු හොඳ නායකයෙකි. තිස්සමහාරාම වෙනුවෙන් වැඩි සේවාවන් රැසක් සිදු කර ඇති නිහතමානී නායකයෙකි. ගරු සභාපතිතුමාගේ නිවැරදි වැඩපිළිවෙල බුද්ධිමත්භාවය නිසා අප සියලුම දෙනාට හොඳ මඟපෙන්වීමක් ලබා දෙන ලදී. අප ඉටු කරන්නාවූ සේවාවන් වෙනුවෙන් ගරු සභාපතිතුමා ලබා දුන් සහායට එතුමන්ට ස්තුතිය පුද කරන ලදී.

මේ ආ ගමන තුළ සභිකයෙක් ලෙස කටයුතු කිරීමේ දී යම් වැරැද්දක් සිදු වුවා නම් ඒ සඳහා සමාව අයදිමි. මෙම කාලය සිදු කරන්නා වූ සෑම කාර්යයක් වෙනුවෙන්ම ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා, ගරු සභිකයින්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය ලබා දුන් සහාය ස්තුතිය පුද කරන ලදී.

ලබන්නාවූ 2023 නව වසර සියලුම දෙනාට නිදුක් නීරෝගී වාසනාවන්ත සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ <u>**ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතාගේ අදහස් දැක්වීම**</u>

ලබන්නා වූ 2023 නව වසර රටවාසී ලෝකවාසී සියලුම ජනතාවට සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමි.

අද අප පත් වූ මෙම පාලන කාලය තුළ අදහස් දක්වන අවසන් කතාවද, තව කාලයක් සිට කටයුතු කිරීමට හැකි වේද යන්න තවම කිව නොහැක. නව සභිකයෙක් ලෙස අත්දැකීම් ලබා ගනිමින් ජනතාව වෙනුවෙන් වැඩ කළ කාලය ඉතාමත් සුන්දරය. මහා සභාව තුළ පක්ෂ විපක්ෂව කටයුතු කළද, සභාවෙන් එළියට ගිය පසුව දේශපාලන මතවාද නොමැතිව සියලුම දෙනා සමඟ සහෝදරයින් සේ කටයුතු කරන ලදී. නව සභිකයෙක් ලෙස පත් වුවත් තම කොට්ඨාසය සඳහා විශාල වැඩ කොටසක් කිරීමට බලාපොරොත්තුවෙන් සිටියත්, රට තුළ ඇති වූ ඇතැම් අර්බුධකාරී තත්ත්වයන් නිසා සිතූ පරිදි වැඩ කොටසක් සිදු කිරීමට නොහැකි වුවත්, තම කොට්ඨාසයේ සංවර්ධන කටයුතු බොහොමයක් සිදු කළත්, අද වන විට මිනිසුන්ට සිදු කළ කිසිදු දෙයක් මතකයේ නොමැත. ජනතාව වෙනුවෙන් කැප වී සේවය කළද, අවසානයේ එම කිසිවක් කිසිදු කෙනෙකුගේ මතයේ නොපවතී. මෙලෙස ගත් කළ දේශපාලනය කිරීම ඇතැම් විටක මානසික පීඩාවක් ද ගෙන දෙන්නක් ලෙස කිව හැකිය.

මා දේශපාලන දිවියට පැමිණියේ මාගේ පියා දේශපාලනය සිදු කළ නිසාය. ඒ හරහා ආ දේශපාලන ගමන මගින් බොහෝ දේ ලබා ගත් බව සඳහන් කළ යුතුය.

තිස්සමහාරාමය තුළ මේ වන විට අයිස් මත්ද්‍රව්‍ය භාවිතය වැඩි වී ඇත. අප අනාගත පරපුර දරුවන් බොහොමයක් මේ සඳහා පෙළඹී ඇති බැවින්, අප අනාගත පරපුර රැක ගැනීම සඳහා අයිස් මත්ද්‍රව්‍ය තිස්සමහාරාමයෙන් තුරන් කිරීමට අවධානයෙන් යුතුව කටයුතු කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

මහසෙන්පුර ආදාහනාගාරය සඳහා බොහෝ ජනතාවක් ආදාහන සිදු කිරීමට පැමිණෙනු ඇත. එකී ආදාහනාගාරයට පිවිසෙන මාර්ගය ගිලා බැස ඇති බැවින්, වාහන ගමන් කිරීමේදී දැඩි අපහසුතාවන්ට පත් වීමට සිදු වේ. එම නිසා මෙකී මාර්ගය සකස් කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතාගේ අදහස් දැක්වීම**

අප පත් වී මේ වන විට වසර 05 ක කාලයක් ගත වී ඇත. දැනට රට තුළ පවතින වතාවරණය අනුව ප්‍රාදේශීය සභා කාලය මේ වන විට අවසන් විය යුතුය. රට තුළ දැනට තිබෙන තත්ත්වය අනුව ජනතා මතය විමසා මැතිවරණයක් පැවැත්වීමට කටයුතු කළ යුතුය.

සභාව තුළ කටයුතු කළ කාලය තුළ වාද විවාද සංවාද ඇති කරමින් කටයුතු කළද, අපගේ දේශපාලන ප්‍රතිපත්ති මාලාව අනුව එසේ කටයුතු කළ බවත්, සංවාද වාද විවාද කළ යුතු අවස්ථාවන් සඳහා අප එලෙස කටයුතු කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

රට තුළ ඇති වූ පොහොර ගැටළුව නිසා ආණ්ඩුව විවේචනයට ලක් වුවද, අපගේ මතය එදා දැරුවේ නම් අද වන විට ආණ්ඩුව එලෙසටම පවතින බව සඳහන් කරන ලදී.

විදුලි වැට ගැසීම සම්බන්ධයෙන් යම් යම් තීන්දු තීරණ ගත්තද, විදුලි වැටේ යම් සීමාවක් වෙන් කර විදුලි වැට ගැසීමට කටයුතු කරයි. මෙලෙස යම් සීමාවක් වෙන් කර විදුලි වැට ගැසීම සුදුසු නොවන බවත්, මේ සඳහා අදහසක් දැක්වුවහොත් ජනතා විමුක්ති පෙරමුණ පක්ෂය මෙම කාර්යය නතර කලා යැයි දෝෂාරෝපණය එල්ල විය හැකි බැවින්, එහි අසාර්ථකතාවය පෙන්වා දීම සිදු නොකරන ලදී. එක් විදුලි වැටක් තිබියදී, උද්ධකන්දර සිට කතරගමට යන පාර හරහා විදුලි වැට ගැසීම නිසා, අලියා ගම්මාන හරහා ගමන් කිරීම සිදු කරනු ලබයි. එම නිසා මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර, සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීම සුදුසු වන බව ප්‍රකාශ කරන ලදී.

ප්‍රදේශයේ දරු පරපුර බොහොමයක් අයිස් මත්ද්‍රව්‍ය සඳහා පෙළඹී ඇත. අප අනාගත පරපුර මෙයින් මුදවා ගැනීම කළ යුතුය. අප ලංකාව දූපතකි. මෙම දූපත සඳහා ගුවනින්, ගුවන් තොටුපල මගින්, මුහුදින් මෙම මත්ද්‍රව්‍ය ගෙන ඒම සිදු කරයි. අයිස් මත්ද්‍රව්‍ය ව්‍යාප්ත වීම වළක්වා ගැනීම සඳහා පාසල් දරුවන්ගේ පොත් බෑග් පරීක්ෂා කිරීම් කර, ළමුන් අපහසුතාවයට පත් නොකර, ලංකාව සඳහා මෙම මත්ද්‍රව්‍ය ගෙන එන පුද්ගලයින් හසු කර ගැනීමට කටයුතු කළ යුතුය. මත්ද්‍රව්‍ය ගෙන ඒම නතර කළහොත් අපගේ අනාගත දරු පරපුරද අපට බේරා ගත හැකි වනු ඇත. මත්ද්‍රව්‍ය සඳහා දරුවන් පෙළඹීම ප්‍රදේශයෙන් ප්‍රදේශයට නතර කිරීම කිසි විටෙක කළ නොහැක. එම නිසා මත්ද්‍රව්‍ය ලංකාවට ගෙන එන මූලික තැන මුලින්ම සොයා ගත යුතු බව ප්‍රකාශ කරන ලදී. උදාහරණයක් ලෙස පොලිස් වැටලීම් ගත් කළ, පොලිස් ස්ථානවලින් රට තුළ විවිධ වැටලීම් කළද, මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වැටලීම් සිදු නොකරන්නේ ඒ සඳහා දේශපාලන අධිකාරිය සම්බන්ධ වී තිබීම නිසා බව සඳහන් කළ යුතුය.

සභාවේ කටයුතු කළ කාලය තුළ විවිධ මතිමතාන්තර ඇති කටයුතු කරන ලද්දේ අපගේ ප්‍රතිපත්තිවලට අනුකූලව කටයුතු කළ යුතු නිසාවන්ය. අපගේ දේශපාලනය තුළ අප හට කුමන ලේබල් ගැසීමට කටයුතු කළත්, අපගේ පක්ෂයේ ප්‍රතිපත්තිමය මතයේ සිට අප කටයුතු කරනු මිසක, කිසිදු ගැටළුවක් ඇති කර ගැනීමට එසේ නොකරන බව ප්‍රකාශ කර සිටින ලදී.

අප සභිකයින් ලෙස කටයුතු කිරීමේ දී ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය ලබා දුන් සහායට ස්තුතිය පුද කරන ලදී.

2023 වසර තුළ ප්‍රදේශයට රටට යහපතක් ලැබේවායි ප්‍රාර්ථනා කරන අතර, රට නිවැරදි දිශාවකට ගෙන යාමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ **ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා**

දැනට ඉදි කිරීමට නියමිත විදුලි වැට ගැසීම ගොවි සංවිධාන හරහා යෝජනා කර ඇති බව සඳහන් කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා සභික, වාලි ගුණරත්න මහතා**

නව විදුලි වැටක් ඉදි කිරීම වෙනුවට ගොඩේ කලපුවෙන් ආරම්භ කර ඇති විදුලි වැට සක්‍රීය කර දෙන ලෙසට ඉල්ලීම් කිරීම සුදුසු වේ.

❖ **ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**

ඉදි කිරීමට නියමිත විදුලි වැට සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණ පක්ෂය සහ අප පක්ෂය එකට එකතු වී එක් වේදිකාව හිද, යම් සීමාවක් ලකුණු කර විදුලි වැට ගැසීම සාර්ථක නොවන බවට ජනතාවට කරුණු පැහැදිලි කිරීමක් සිදු කිරීමට අවස්ථාවක් ගතහොත්, ඒ සඳහා ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයට ද අදහස් දැක්වීමට ආරාධනා කරන ලදී.

විදුලි වැට ගැසීම සම්බන්ධයෙන් සාකච්ඡාවක් ලබා ගැනීම සඳහා වනජීවි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, වනජීවි දෙපාර්තමේන්තුවට අදාළ නිලධාරීන්, ගොවි සංවිධාන නිලධාරීන් සහ ගරු චමල් රාජපක්ෂ මැතිතුමාගේ සම්බන්ධීකරණ නිලධාරියෙක් සම්බන්ධ කර ගන්නා ලෙසට තීරණය කරන ලදී.

මත්ද්‍රව්‍ය භාවිතය ඉතාමත් බරපතල කරුණක් වී ඇත. අප ප්‍රදේශය පුරාම මෙය දැඩි සේ ව්‍යාප්ත වී ඇත. අපගේ දරු පරපුර රැක ගැනීම සඳහා සියලුම දෙනා එක්ව කටයුතු කළ යුතුය. රට තුළ දරු පරපුර විනාශ වන දැඩි අවධානම් තත්ත්වයක තිබෙන මත්ද්‍රව්‍ය රටින් තුරන් කිරීමට අවශ්‍ය පියවරයන් ගන්නා ලෙසට අතිගරු ජනාධිපතිතුමා වෙත සහ පොලිස්පතිතුමා වෙත දන්වා යැවිය යුතු බවත්, අප මුලින් ක්‍රියාත්මක වී තිස්සමහාරාමයෙන් මෙම මත් උවදුර වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය.

❖ **ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතාගේ අදහස් දැක්වීම**

රට තුළ ඇති වූ තත්ත්වයන් හමුවේ ප්‍රදේශයේ දරුවන් හට බොහෝ දුරට ප්‍රායෝගික ක්‍රියාකාරකම් අඩු වීමත් මත්ද්‍රව්‍ය සඳහා පෙළඹීමට හේතු වී ඇත. යෝධකණ්ඩිය විදුහලේ වොලිබෝල් ක්‍රීඩාපිටිය සකස් කර ගැනීමට හැකි වූ බවත්, ඒ සඳහා අවශ්‍ය සම්පත් ලබා දෙමින් ලබා දෙන්නාවූ සහාය ගරු සභාපතිතුමාට ස්තුතිය පුද කරන බවත් ප්‍රකාශ කරන ලදී.

සියඹලාගස්වැව රුවන් වැවට ඉහලින් තවත් වැවක් සකස් කර ඇති බැවින්, ගොවි ජනතාවගේ ගොවි බිම් සඳහා ජලය ගෙන යන ජල පෝෂක ප්‍රදේශ ඇහිරී ඇත. මේ සම්බන්ධයෙන් සොයා බලා ඉදිරි අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

පසුගිය වර්ෂයන්වල උපාධිධාරීන් සඳහා රැකියා ලබා දීමට කටයුතු කළද, තවමත් රැකියා ලබා ගැනීමට නොහැකි වී ඇති උපාධිධාරීන් අප ප්‍රදේශයේ සිටින බැවින්, ඔවුන්ගේ වයස් සීමාව ඉක්මවා යාමට පෙර එම උපාධිධාරීන් සඳහා ද රැකියා ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ දී සාකච්ඡා කරන ලෙසට ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

විදුලි වැට ගැසීම සම්බන්ධයෙන් පසුගිය දිනක ක්ෂේත්‍ර පරීක්ෂණයක් ද සිදු කරන ලදී. වනජීවි දෙපාර්තමේන්තුවේ විදුලි වැට පසුපසට ගෙන, ජනතාවට සාධාරණයක් ඉටු වන සේ කටයුතු කරන බවට තීරණය කර තිබුණද, එහිදී යම් පුදගලයෙකු සිදු කළ ප්‍රකාශයක් නිසා එම කාර්යය නතර වී ඇති බැවින්, මේ සම්බන්ධයෙන් සොයා බලන ලෙසට ඉල්ලා සිටින ලදී.

දැනට සිටින ගරු සභිකයින්ම නැවතත් තොරා පත් කර ගැනීම ජනතාවගේ තීරණයයි. නමුත් ජනතාව වෙනුවෙන් ජනතාවාදී සේවයක් ඉටු කරනු ලැබූ මහජන නියෝජිතයින්ම නැවත මැතිවරණයෙන් තේරී පත්ව තිස්සමහාරාමයට වඩාත් වැඩි සේවයක් කිරීමට හැකි වේවායි මා ප්‍රාර්ථනා කරමි. මා නැවත දේශපාලනය සිදු නොකිරීමට තීරණය කර තිබුණද, ජනතාව වෙනුවෙන් කතා කළ යුතු සුවිශේෂී කරුණක දී මා ඒ වෙනුවෙන් පෙනී සිට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදී.

යෝධ වැව සොරොව්වෙහි වතුර කාන්දුවීම සම්බන්ධයෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත දන්වා, එය සකස් කර ගත යුතු බව ප්‍රකාශ කරන ලදී.

ලබන්නා වූ 2023 නව වසර සියලුම දෙනාට සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණී මහතාගේ අදහස් දැක්වීම**

මේ දක්වා වසර 05 ක කාලයක් ප්‍රාදේශීය සභාවේ කටයුතු කරන ලදී. එම වසර 05 ක කාලය තුළ රට තුළ ඇති වූ යම් යම් අර්බුධකාරී තත්ත්වයන් නිසා, තිස්සමහාරාම බල ප්‍රදේශයේ ජනතාවට

ප්‍රාදේශීය සභාව මගින් වැඩි වැඩ කොටසක් ඉටු කර දීමට නොහැකි වුවත්, හැකි පමණින් ජනතා සේවයක් සිදු කිරීමට ඇප කැප වු ගරු සභාපතිතුමාට ස්තුතිය පුද කරන ලදී.

විපක්ෂය ලෙස ගරු සභාපතිතුමාගේ නිවැරදි වැඩපිළිවෙල සඳහා ලබා දිය යුතු සෑම සහායක්ම ලබා දී ඇත. ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේ ගරු සභික, ආර් රජිත ප්‍රියදර්ශන මහතා සෑම කමිටුවක් සේම, විශේෂ සාකච්ඡාවන් සඳහාම පෙනී සිට කටයුතු කිරීම වෙනුවෙන් ස්තුතිය පුද කරන ලදී. එසේම එම පක්ෂයේම ගරු සභික, වැල්ලගේ ජීවානි මහත්මියත් තම පරාසයේ හිද ජනතා වෙනුවෙන් කටයුතු කිරීම පිළිබඳ ස්තුතිය පුද කරන ලදී. දේශපාලනය කිසි දිනක පෞද්ගලිකත්වය ඉස්මතු කර නොගෙන, ජනතාව වෙනුවෙන් ගනු ලබන තීන්දු තීරණ සඳහා ජනතා විමුක්ති පෙරමුණ පක්ෂය ලබා දුන් සහාය ස්තුතිය පුද කරන ලදී.

ගරු සභාපතිතුමා නිවැරදි විනිවිදභාවයෙන් යුතුව කටයුතු කරන නිවැරදි නායකයෙකි. එතුමන් ජනතාව වෙනුවෙන් සිදු කරන්නා වු නිවැරදි වැඩපිළිවෙල සඳහා අපගේ සහාය සෑම දිනකම ලබා දී ඇති බව සඳහන් කරන ලදී.

මා නියෝජනය කළ සෑම පාලන කාලයකදීම තිස්සමහාරාමයේ සංවර්ධනය උදෙසා ජනතාව වෙනුවෙන් සකස් කරන ලද අයවැය සඳහා හෘද සාක්ෂියට එකඟව මා ඇතුළු මාගේ කණ්ඩායම සහාය ලබා දී ඇත. අපගේ එම ක්‍රියාකලාපය නිසා යම් යම් සංවර්ධන කටයුතුවලදී එය අස්වැසිල්ලක් වු බව කිව යුතුය.

පාරම්පරික ගොවි ජනතාවට වගා කිරීමට බිම් අගලක් නොමැති වන ලෙසට වනජීවි දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරයි. වනජීවීන්, පරිසරය සේම ජනතාවත් අපට අවශ්‍යයි. වනජීවි දෙපාර්තමේන්තුව විසින් ගන්නා ලද අත්තනෝමතික ක්‍රියාකලාපයන් නිසා පාරම්පරික හේන් ගොවියාට වගා කිරීම සඳහා තිබෙන ඉඩම් අහිමි කරවීමට කටයුතු කර ඇත. වනජීවීන් කැලෑවෙන් නගරයට පැමිණෙන තත්ත්වයක්ද අද වන විට උදා වී ඇත. එසේ ඉදිරියට සිදු වුවහොත් වනජීවි ජීවිතවලට දැඩි තර්ජනයක් ද එල්ල විය හැක.

මැදවැලැන, සේනපුර, ගඟසිරිපුර, රෝහණපුර ප්‍රදේශවල මුව රංචුවක් ව්‍යාප්ත වීමෙන් එම ප්‍රදේශවලට දැඩි හානිකර තත්ත්වයක් ඇති වී ඇත. මෙම මුව රංචුව එම ප්‍රදේශවල ගොවිතැන් විනාශ කර දැමීමට කටයුතු කර ඇත. මෙම මුව රංචුව නිසා එම ප්‍රදේශවලට දැඩි හානිකර තත්ත්වයක් උද්ගත වී ඇත. පසුගිය දිනක මුවෙක් වාහනය හැපීමෙන් මිය ගිය අවස්ථාවක්ද තිබේ. එම නිසා මෙම මුව රංචුව ආරක්ෂා කර ගැනීමටත්, මුව රංජුව මගින් වගාවන් සඳහා සිදු වන හානිය වළක්වා ගැනීමටත් අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙසට ඉල්ලා සිටින ලදී.

එලෙසම මොණර ග්‍රහණය වැඩි වීම නිසාත් ජනතාවට වගාවන් කිරීමට නොහැකි වී ඇති බැවින්, මේ සම්බන්ධයෙන් අදාළ ආයතනයන් වෙත දන්වා යවන ලෙසට ඉල්ලා සිටින ලදී.

අප කාලය වසර 04 කට සීමා වී තිබියදී ඒ සඳහා තවක් අවුරුද්දක් දීර්ඝ කර අවස 05 ක් දක්වා අද වන විට අප කටයුතු කර ඇත. විපක්ෂයෙන් ලබා දිය යුතු සහායන් ගරු සභාපතිතුමාට ලබා දීම වෙනුවෙන් පක්ෂයේ ගරු සභිකයින් වෙත තම ස්තුතිය පුද කරන ලදී. එසේම අප ඉල්ලීම් කරන ලද සෑම කාර්යයක්ම ඉටු කර දීම වෙනුවෙන් ගරු සභාපතිතුමාට, ගරු උප සභාපතිතුමාට, ගරු සභිකයින්ට, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයට ස්තුතිය පුද කරන ලදී. අප ගත කල කාලය තුළ ගරු සභිකයින් ලෙස ගරු සභාපතිතුමාට සහාය ලබා දෙමින්, නීතියට අනුගතව පනතේ රෙගුලාසිවලට යටත්ව කටයුතු කිරීම පිළිබඳ සතුටු විය හැකිය.

අප පාලන කාලය අවසන් වී නැවත මැතිවරණයක් පවත්වා දැනට සිටින ගරු සභිකයින්ට නැවත පැමිණීමට හැකි වුවහොත් ලබා ගත් අත්දැකීම් ද සමඟින් පනතේ සඳහන් පරිදි නිවැරදිව ජනතා සේවයක් සිදු කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

2023 වසර තුළ රට පත්ව ඇති අගාදයෙන් ගොඩ ගැනීමට ලබා දිය යුතු සහායන් ලබා දී රට ගොඩගැනීමටත්, මත් රකුසාගෙන් අප අනාගත දරු පරපුර බේරා ගැනීමටත් කැපවීමෙන් කටයුතු කළ යුතු බව සඳහන් කරන ලදී.

ජනතාව වෙනුවෙන් පෙනී සිට කටයුතු කිරීමේදී ලබා දුන් සහායට විපක්ෂයක් ලෙස තම ස්තුතිය නැවත වරක් පුද කරන ලදී.

2023 නව වසර රට යහපත් තැනකට ගෙන යා හැකි සාර්ථක සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ **<u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතාගේ අදහස් දැක්වීම</u>**

අප පත් වූ මෙම කාලය තුළ ගරු සභිකයින් සඳහා පුහුණු වැඩසටහන් ලබා දීමට කටයුතු කළ අවස්ථාවක ගරු සභික, පී.කේ. ආරියසේන මහතා ඒ සඳහා සම්බන්ධ වී කටයුතු කර, අවශ්‍ය දැනුම ලබා ගැනීමට කටයුතු සිදු කිරීම වෙනුවෙන් එතුමන්ට ස්තුතිය පුද කරන ලදී.

2023 වර්ෂයේ අයවැය සභා සම්මත වූ නොවැම්බර් මස මහා සභාව වාර්තාව සම්මත වූයේ අද දිනයි. ඒ අනුව අද දින 2023 වර්ෂයේ අයවැය සම්මත කළ දිනය ලෙසද හැඳින්විය හැකිය. 2023 වර්ෂයේ ඉලක්ක ගත ආදායම් සපුරා ගනිමින් තිස්සමහාරාමයට වැඩි වැඩ කොටසක් සිදු කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

2011 වර්ෂයේ සිට මා මහජන නියෝජිතයෙක් සේ පෙනී සිට කටයුතු කර ඇත. එලෙස කටයුතු කළ කාලයන්ට වඩා මෙම කාලය තුළ ගරු උප සභාපතිතුමා, ගරු සභිකයින්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය මා හට දැඩි සහයෝගයක් ලබා දී කටයුතු කිරීම වෙනුවෙන් සියලුම දෙනාට ස්තුතිය පුද කරන ලදී.

එසේම අප මහා සභාව මගින් සම්මත කර දෙන ලද යෝජනා ක්‍රියාවට නැංවීම සිදු කරන ලද්දේ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයයි. අප සම්මත කර දෙන යෝජනා සාර්ථක ලෙස සිදු කිරීම වෙනුවෙන් එම සියලු දෙනාටත් ස්තුතිය පුද කරන ලදී.

අප පාලන කාලය තුළ මහා සභාවට ඉදිරිපත් කරන ලද සෑම යෝජනාවක්ම ගරු සභිකයින් විසින් සම්මත කර දීමට කටයුතු කළ නිසා, එම යෝජනා සාර්ථකව ක්‍රියාත්මක කර ගැනීමට හැකි වී ඇත. එලෙස අප පාලන කාලය තුළ ජනතාව වෙනුවෙන් සහ බල ප්‍රදේශයේ සංවර්ධනය වෙනුවෙන් සිදු කරන ලද වැඩසටහන් පෙල ගැස්මක් අද දින සියලුම දෙනාට දැන ගැනීම සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු සුදානම් කර ඇත.

පසුගිය දින පැවැති විගණන කළමනාකරණ කමිටුවේ දී තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව නිවැරදි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර ගෙන යන බව සඳහන් කරමින් අප ආයතනය අගයන ලදී. එලෙස අප ආයතන සඳහා ගෞරව නාමයන් ලබා ගැනීම සඳහා ගරු උප සභාපතිතුමා, ගරු සභිකයින්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් දැඩි සහායක් ලබා දුන් අතර, ඒ වෙනුවෙන් මා එම සියලුම දෙනාට ස්තුතිය පුද කරන ලදී. එසේම අප සියලුම දෙනා එක්ව සාර්ථක ගමනක් යන නිසා, අද වන විට ප්‍රාදේශීය සභාව හොඳ තැනක තැබීමට හැකි වී ඇති බවත් සඳහන් කළ යුතුය.

ඉදිරියේ දී සභාව විසුරුවාලීමට කටයුතු කළහොත්, ඉන් පසු දිනම විශේෂ මහා සභාවක් රැස් කර සමුගැනීමට අදාළ කටයුතු සිදු කරන බව සියලුම දෙනාට දන්වා සිටින ලදී.

අද දින මහා සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබා දුන් ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්ට හා ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරී මහත්මියටත්, ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ස්තුතිය පුද කිරීමෙන් අනතුරුව ප.ව. 04.00 ට පමණ මහා සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වාර්තා කළේ - ඩී. රුවිනා දීපානි,
ලේකම්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

සභාපති,
ඩබ්ලිව්.ජී. උපුල්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

2022.12.20 දින තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.